2023 පෙබරවාරි 5 ඉරිදා



## ජීවිතයක් බිලි ගත් විහිළුවක්

පිටුව 16



## යන්න ගියා දෙන්නම මේ ලොවෙන් සමුගෙන

පිටුව 14



## ලක් මව රනින් සැරසූ පොලිස් දියණිය

පිටුව 06



# දෙයියන්දර නිවෙසක සිර කළ යුවතිය කියන බිහිසුණු කතාව

පිටුව 8-9






# ගලෙන් ගසා හිලෙන් පැන්න බදුල්ලේ කමිස හොරු

## රුපියල් ලක්ෂ 28ක කමිස හුණුකොටුවේ ගබඩාවකින් පන්නලා

නිමි ඇඳුම් ගබඩාව පවත්වාගෙන ගිය නිවෙස



■ සී. ගමගේ –
සොරණාතොට සමූහ

**බදුල්ල නගරයේ ප්‍රසිද්ධ ප්‍රධාන පෙළේ නිමි ඇඳුම් ව්‍යපාරිකයෙකුට අයත් බදුල්ල හුණුකොටුව ප්‍රදේශයේ දෙමහල් නිවෙසක පිහිටි නිමි ඇඳුම් තොග ගබඩාවකින් කාලයක් පුරා ඉතා සූක්ෂ්ම අයුරින් සොරකමක් සිදු වී තිබිණි. පසුගියදා එම නිමි ඇඳුම් තොග ගබඩාවෙන් රුපියල් ලක්ෂ 28ක් පමණ වටිනා කමිස තොගයක් සොරාගෙන ගොස් විකිණීමේ ජාවාරමක නිරතව සිටි පුද්ගලයන් එකොළොස් දෙනෙකු පසුගියදා පොලිසියට කොටු විය. එම සොරුන් 11 දෙනා සොරකම් කරන ලද කමිස ඌව පළාතේ ප්‍රධාන නගරවල අලෙවි කරමින් සිටියදී එලෙස අත්අඩංගුවට ගැනුණේ බදුල්ල මූලස්ථාන පොලිසියේ විමර්ශන කණ්ඩායමක් විසිනි.**

මේ මහා පරිමාණ සොරකම මත්ද්‍රව්‍ය භාවිතයට තදින්ම ඇබ්බැහි වී සිටි වයස අවුරුදු 20-30 අතරේ පසුවන බදුල්ල අමුනුවැල්පිටිය, සුමනතිස්සගම, දෙයියන්නේවෙල, පුවක්ගොඩමුල්ල යන නගරවල පදිංචි තරුණයන් පිරිසකි. ඔවුන් කාලයක් තිස්සේ මෙම සොරකම කරගෙන ගොස් තිබුණත් පිරිස අත්අඩංගුවට ගැනීම ලෙහෙසි පහසු නොවීය. කිසිම බියක් චකිතයක්, සැකයක් නොමැතිව මොවුන් දිවා රාත්‍රී දෙකෙහිම මෙම නිමි ඇඳුම් තිබූ දෙමහල් නිවෙසේ ගබඩා කාමරයට ඇතුළු වී එහි කාඩ්බෝඩ් පෙට්ටිවල අසුරා තිබූ කමිස සොරාගෙන ගොස් ඇත්තේ කිසිවෙකුට සැකයක් ඇති නොවන අයුරිනි.



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ල

මේ පිරිස බණ්ඩාරවෙල, වැලිමඩ, හාලිඇළ, බඩල්කුඹුර, වැල්ලවාය, පස්සර වැනි නගරවල පදික වේදිකාවේ මෙන්ම සති පොළවල මේ කමිස අලෙවි කිරීමට ගෙන ගොස් ඇත්තේ ත්‍රිරෝද රථ දෙකක පටවාගෙනය. රුපියල් 1300ක් පමණ වටිනා මෙම කමිස රුපියල් 300, 400 වැනි ඉතා අඩු මිලට විකුණා ඇති බවත්, එම නගරවල රෙදි කඩවලටද මොවුන් මෙම කමිස විකුණා ඇති බවට තොරතුරු අනාවරණය කර ගැනීමට පොලිස් නිලධාරින්ට හැකි වූයේ සිදු කරන ලද විමර්ශනයේදීය.

බදුල්ල නගරයේ ප්‍රසිද්ධ මෙම නිමි ඇඳුම් ව්‍යාපාරිකයා හුණුකොටුව මාර්ගයේ ජනාකීර්ණ ස්ථානයක පැරණි දෙමහල් නිවෙසක සිය නිමි ඇඳුම් තොග ගබඩාව පවත්වාගෙන ගොස් ඇත්තේ කලෙක සිටය. ව්‍යාපාරිකයා සිය වෙළෙඳ සැලේ ඇඳුම් විකිණී අවසන් වන අවස්ථාවලදී මේ තොග ගබඩාවට සේවකයන් සමග පැමිණ එහි තිබූ නිමි ඇඳුම් වෙළෙඳසැලට අවශ්‍ය ප්‍රමාණයට රැගෙන ගොස් තිබුණි. නමුත් සුපුරුදු පරිදි වෙළෙඳසැලට අවශ්‍ය නිමි ඇඳුම් රැගෙන යාමට තොග ගබඩාව පිහිටි නිවෙසට පැමිණි ව්‍යාපාරිකයාට දෙමහල් නිවෙසේ උඩ තට්ටුවේ එක් ජනේලයක වීදුරුවක් කැඩී තිබෙනු දැක කිසියම් සැකයක් හටගෙන ගබඩාවේ තිබූ නිමි ඇඳුම් පරීක්ෂාවට ලක්කර තිබුණි.



සහකාර පොලිස් අධිකාරි බුද්ධික ගුණසේකර

එහිදී අදාළ ගබඩාවේ තිබූ රුපියල් ලක්ෂ 28ක පමණ වටිනා කමිස තොගයක් අඩුවී ඇති බවට අනාවරණය වීමත් සමග එම ව්‍යාපාරිකයා මේ සම්බන්ධයෙන් බදුල්ල පොලිසියට පැමිණිලි කළේය.

බදුල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ලගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරි 1 බුද්ධික ගුණසේකරගේ අධීක්ෂණයෙන් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට බදුල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. රත්නායක, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බී. එම්. අබේපාල යන නිලධාරීන්ට වගකීම පැවැරීය. ඒ අනුව බදුල්ල පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ පොලිස් කණ්ඩායමක් දිවා රෑ නොබලා පරීක්ෂණ කටයුතු සිදු කළේ කමිස සොරුන් අල්ලා ගැනීමට අවශ්‍ය තොරතුරු සොයා බැලීම සඳහාය. බණ්ඩාරවෙල නගරයේ සති පොළේ අඩු මිලට කමිස විකුණන බවට තොරතුරක් මෙම පොලිස් කණ්ඩායමට ලැබෙන්නේ මේ විමර්ශන සිදු කැරෙන අතරතුරදීය.

ඒ අනුව වෙස්වළා ගත් පොලිස් නිලධාරීන් පිරිසක් බණ්ඩාරවෙල නගරයට ගොස් සති පොළ සහ අවට ප්‍රදේශයේ ගැවසෙමින් පරීක්ෂණ කටයුතු සිදු කළේ ලැබුණු තොරතුරු නිවැරදිදැයි සොයා බැලීම සඳහාය. බණ්ඩාරවෙල සති පොළේ කමිස විකුණන පුද්ගලයන්ගෙන් ප්‍රශ්න කළ පොලිස් නිලධාරීන් දිගින් දිගටම පරීක්ෂණ සිදු කළේ බදුල්ලේ කමිස සොරුන් නිශ්චිතවම සොයා ගැනීම සඳහාය. බණ්ඩාරවෙල සති පොළේ කමිස විකුණමින් සිටි පුද්ගලයන් දෙදෙනකු විකිණීමට තිබූ කමිස තොගයක් සමඟ පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවට ගන්නේ ඉන් අනතුරුවය. ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේදී මෙම නිමි ඇඳුම් සොරකම සම්බන්ධයෙන් සියලුම තොරතුරු හෙළි විය. ඒ අනුව කමිස සොරකම සම්බන්ධයෙන් පුද්ගලයන් එකොළොස් දෙනෙකු බදුල්ල පොලිසිය මඟින් අත්අඩංගුවට ගන්නා ලදී. සොරා ගත් කමිස ප්‍රවාහනය කිරීමට යොදා ගත් ත්‍රිරෝද රථ දෙකක් ද පොලිසිය විසින් සොයාගෙන තිබිණි.



බදුල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. රත්නායක

බණ්ඩාරවෙල, බදුල්ල, හාලිඇළ, බඩල්කුඹුර නගරවල ඇතැම් වෙළෙඳසල්වලට විකුණා තිබූ කමිස සැකකරුවන්ගේ තොරතුරු මත සොයා ගැනීමටද පොලිස් නිලධාරීන්ට හැකි විය. අත්අඩංගුවට ගත් සැකකරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට තදින්ම ඇබ්බැහි වූවන් බවත්, මොවුන්ට මත්ද්‍රව්‍ය සහ සොරකම් සම්බන්ධයෙන් පෙර වැරදි රැසක් තිබෙන බව පොලිසිය සඳහන් කළේය.

අත්අඩංගුවට ගත් ප්‍රධාන සැකකරුවන් තිදෙනකු වන බදුල්ල දෙයියන්නේවෙල පදිංචි 32 හැවිරිදි ගාමිණී නොහොත් අක්කුන්, අමුනුවැල්පිටිය 22 හැවිරිදි කුරල් අරසම් රොෂාන්, සුමනතිස්සගම පදිංචි 28 හැවිරිදි නිමේෂ් රුක්මල් යන තිදෙනා බදුල්ල අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට බදුල්ල මහේස්ත්‍රාත් එම්. නුජිත්ද සිල්වා නියෝග කළේය. සැකකරුවන් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකට ඉදිරිපත් කරන ලෙසටද නියම කැරිණි. සෙසු සැකකරුවන් අට දෙනා ඇප මත මුදා හැරිණි.



අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බී. එම්. අබේපාල

බදුල්ල කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුජිත් වෙදමුල්ලගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරි 1 බුද්ධික ගුණසේකරගේ අධීක්ෂණයෙන් බදුල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. රත්නායක, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක බී. එම්. අබේපාල, උපපොලිස් පරීක්ෂක කුමාරරත්න, සැරයන් 6742 ප්‍රභාකරන්, 17352 වසන්ත, 54238 ගාමිණී, 53778 ජයසිංහ, 20821 රත්නායක යන නිලධරීන් වැඩිදුර පරීක්ෂණ පවත්වති.

සිළුමිණ – මාංචු
ලේක්හවුස්,
කොළඹ 10.
www.silumina.lk/maanchu

මාංචු ආරම්භය : 2011 ජුනි 07

● දැන්වීම් කළමනාකරු : 011 242 9351 / Silumina.advt@lakehouse.lk

● දුරකථන : 011 242 9264
011 242 9265

● ඊ මේල් : editor.silumina@lakehouse.lk

● ෆැක්ස් : 011 242 9260




# මහනුවර සිල්වෙස්තර මුරකරුට මරු කැන්දූ දුරකතන ඇමතුම




ඝාතනය සම්බන්ධයෙන් පොලිසිය පරීක්ෂණ පවත්වන අයුරු

■ අසේල කුරුළුවංශ

**මහනුවර ශාන්ත සිල්වෙස්තර ක්‍රීඩාංගණය පිහිටා තිබෙන්නේ අධි ආරක්ෂිත කලාපයක් සේ සැලකිය හැකි ස්ථානයකය. ක්‍රීඩාංගණයට යාබදව පිහිටා ඇති සුමංගල විදුහලේ වැට සීමාවේ පොලිස් නිල සුනඛ අංශය පිහිටා තිබේ. ඊට නුදුරින් අස්ගිරි මහා පිරිවෙනට ප්‍රවිෂ්ට මාර්ගය පිහිටා ඇති අතර ක්‍රීඩාංගණයට පෙනෙන දුරින් පිහිටි එහි ගේට්ටුව අසල පැය 24 පුරා ක්‍රියාත්මක හමුදා ආරක්ෂක ඒකකයකි. ක්‍රීඩාංගණයට පහළින් සහකාර පොලිස් අධිකාරී කාර්යාල මෙන්ම පොලිස් නිල නිවාස ද පිහිටා ඇත. මේ ආකාරයට ආරක්ෂිත වටපිටාවක පිහිටි සිල්වෙස්තර ක්‍රීඩාංගණයේ මුරකරු අමානුෂික ලෙස පහර දී ඝාතනය කර සිටියදී සොයා ගනු ලැබුවේ පසුගිය 17 දිනය.**


සැකකරු

## උදුල් සම්පත් අවසන් ගමන් යවා බළන්ගොඩට පැන්න තිවංක ඇල්ලුවේ දුරකතන ඇමතුම්වලින්

අතපය බැඳ කටට පාන්කඩ ඔබා ආරක්ෂක නිලධාරියා ඝාතනය කර තිබුණේ ක්‍රීඩාංගණයේ 'ස්කොෂ්' ක්‍රීඩාගාරය ඇතුළතදීය. ක්‍රීඩාංගණයේ පුහුණු වීම් සඳහා පෙර දින පැමිණි සිසුවකු එහි අමතක කර දමා ගිය කුඩයක් රැගෙන යාමට ඔහුගේ පියා පෙරවරු 7.00 ට පමණ පැමිණි අවස්ථාවේ ආරක්ෂක නිලධාරියා එලෙස ඝාතනය කර තිබෙනු දැකීමත් සමග පොලිස් කණ්ඩායම් කීපයක් එහි පැමිණියේ ඝාතකයා සෙවීමේ මෙහෙයුම සඳහාය. ක්‍රීඩංගණයට යාබදව පිහිටි පොලිස් නිල සුනඛ අංශයේ සුනඛයින් ද යොදවා පරීක්ෂා කළත් ඝාතකයා ගිය අතක් සොයා ගැනීමට නොහැකි විය. අවට ස්ථාන කිහිපයක සී.සී.ටී.වී කැමරා දර්ශන ඔස්සේ විමර්ශන සිදු කළ පොලිසිය ඝාතකයා අල්ලා ගැනීමට සිතුවත් ඒ සියල්ල බොඳව ගියේ ඒ කිසිවක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම හේතුවෙනි. මහනුවර පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් මේ ගැන පරීක්ෂණ සිදු කරද්දී මහනුවර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායක විසින් ඒ සම්බන්ධ විමර්ශන කරන ලෙස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයට දැනුම් දෙන්නේ මේ අතරය.

එම ඒකකයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩී.එම්.එල්.බී දිසානායක ඇතුළු කණ්ඩායමක් විමර්ශන ආරම්භ කරන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ උපදෙස් මතය.

මෙසේ ඝාතනය කර තිබුණේ පන්විලගේ උදුල් සම්පත් නමැති අයෙකි. ඔහු තුන්මෝදර පදිංචිකරුවෙකි. විසිඅට හැවිරිදි එක් දරු පියෙකි. ඔහු පෞද්ගලික ආරක්ෂක ආයතනයක් මඟින් සිල්වෙස්තර විද්‍යාලීය ක්‍රීඩාංගණයේ ආරක්ෂාව සඳහා යොදවනු ලැබ සිටියේය. මීට මාස දහයකට පමණ ඉහතදී අදාළ ආයතනයේ සේවයට එක්වූ ඔහු ක්‍රීඩාංගණයේ ආරක්ෂාව සඳහා එම ආයතනය මඟින් යොමු කර තිබුණේ ජනවාරි මස මුල් සතියේදීය. ඝාතනය සිදුව තිබූ ස්ථානයේ තිබී හිස් අරක්කු සහ බීර බෝතල් දෙකක් පොලිසිය සොයා ගත්තේය. ඝාතකයා හඳුනා ගැනීම සඳහා වැදගත් කිසිම හෝඩුවාවක් එහි නොවීම නිසා කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිවරයා උදුල්ගේ ජංගම දුරකතන දත්ත පරීක්ෂාවට ලක් කළේය. ඔහු අවසානයට දුරකතන ඇමැතුමක් ගෙන තිබුණේ 16 වැනි රාත්‍රී 10.30 ට පමණ ය. එම අංකය ඇමතූ අවස්ථාවේ ඊට පිළිතුරු දුන්නේ කාන්තාවකි. වැඩිදුර කරුණු විමසීමේදී අනාවරණය වූයේ ඇය ද උදුල් සේවය කරන ආරක්ෂක සේවා ආයතනයේම සේවයේ නිරත වන බවය. ඒ වන විට මහනුවර නගරයේ ප්‍රසිද්ධ නිමි ඇඳුම් අලෙවි ආයතනයක ආරක්ෂක නිලධාරිනියක ලෙස සේවය කරමින් සිටි ඇය පොලිසියට කැඳවා ප්‍රකාශයක් සටහන් කර ගන්නට පරීක්ෂණ කරන පොලිස් කණ්ඩායම පියවර ගත්තේ උදුල්ගේ ඝාතනය සම්බන්ධයෙන් හෝඩුවාවක් ඇගෙන් ලබා ගැනීමට හැකි වෙතැයි බලාපොරොත්තුවෙනි.

උදුල් එදින රාත්‍රියේ තමාට කතා කළ බවත් එදින පස්වරුවේ ඔහු තිවංක නමැති පුද්ගලයා සමඟ තමන් සේවය කරන ස්ථානයට පැමිණි බවත් ඇය පොලිසියට පැවසුවාය. තිවංක ද අදාළ ආරක්ෂක සේවා ආයතනයේම සේවකයකු වූ අතර ඔහු ඒ වන විට සේවය කරමින් සිට ඇත්තේ මහනුවර තවත් ප්‍රසිද්ධ පිරිමි නිමි ඇඳුම් අලෙවි සැලකය. මේ තිදෙනාගේම ප්‍රධාන සේවා ස්ථාන පිහිටා තිබුණේ සේවා කරන ස්ථානවල සිට මීටර් 500 ක තරම් වූ දුර සීමාවක ය. උදුල්ගේ ඝාතනයෙන් පසු තිවංක ආගිය අතක් නොමැති වීම නිසා මේ ඝාතනයට තිවංකගේ සම්බන්ධයක් ඇතැයි පොලිසිය සැක කළේය. ඒ අනුව තිවංක අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම ආරම්භ විය. ඝාතනය සිදුව දින 09 ක් ගතවෙද්දී සැකකරු පොලිසියට කොටු වන්නේ බළන්ගොඩ නගර මධ්‍යයේදීය. අපරාධයේ සුලමුල හෙළි වන්නේ ඉන් පසුවය.

## එකට සිටි මිතුරාගේ නුගුණ මිතුරියට කියද්දී මිතුරාට ඇසී කළ අපරාධය


මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායක

මේ වන විට විසි පස් හැවිරිදි තිවංක කුඩා කල සිටම ළමා නිවාසයක හැදී වැඩුණු අයෙකි. අවුරුදු 09 ක් වයසැති අක්කා සමග මාස අටක් වයසැති තමන්ව මව විසින් අනුරාධපුර බස් නැවතුමේ දමා ගිය බවත් පසුව ළමා නිවාසයක හැදී වැඩුණු තමන්ට අක්කා ද යළි හමු නොවුණු බවත් ඔහු පොලිසියට පවසා තිබේ. තිවංක නානායක්කාර නමින් ව්‍යාජ ලියවිල්ලක් ඉදිරිපත් කර අදාළ ආරක්ෂක සේවා ආයතනයේ රැකියාවට පැමිණි තිවංක සහ උදුල් මිතුරන් බවට පත්ව ඇත්තේ එකම ආරක්ෂක සේවා ආයතනයේ සේවය කිරීම හේතුවෙනි.

"මේ සිද්ධිය වූ දා හවස උදුල් මම වැඩ කරන තැනට ආවා. හවස අඩියක් ගහමු කිවුවා. අපි කොළඹ වීදියෙන් අරක්කු බාගයකුයි බීර බෝතලේකුයි අරන් සිල්වෙස්තර ක්‍රීඩාංගණයට ගියා. ක්‍රීඩාගාරය ඇතුළේ අපි කතා කරමින් විනෝද වෙවී බිවුවා. අපිත් එක්ක වැඩ කරන කෙල්ලෙකුට මම කෝල් කළා. ටික වෙලාවකින් උදුල් එයාට කෝල් එකක් අරන් කතා කරනවා මට ඇහුණා. මම පිටිපස්සේ ඉඳන් අහගෙන හිටියා. 'මාව ආශ්‍රය කරන්න එපා' කියලා මිනිහා එයාට කියනවා ඇහුණා. 'එයා අනාථ නිවාසෙක හැදුණු යන යන තැන ගෑනු ඉන්න කෙනෙක්. ඔයා එයාව ආශ්‍රය කළොත් සමාජ රෝගත් හැදෙයි' කියලා කිව්වා. 'බලු වැඩ කරන්න එපා යකෝ' කියලා මම ෆෝන් එක උදුරලා අරන් උදුල්ගේ කනට එකක් ගැහුවා. ඊට පස්සේ මම එතනින් ආවා. සිල්වෙස්තර් පිට්ටනිය මැදින් එද්දී උදුල් දුවගෙන ඇවිත් මගේ කම්මුලට ගැහුවා. මම වැලමිටෙන් මුහුණට ගැහුවම මිනිහා බිම වැටුණා. පස්සේ අතපය බැඳලා කටට රෙද්දක් හිර කරලා මම ආවා..."සැකකරු එසේ පොලිසියට පවසා තිබිණි.

උදුල්ගේ හක්ක ප්‍රදේශයට තදබල හානි සිදුව තිබූ අතර දත් පසුපසට තල්ලු වී තිබිණි. සැකකරු වැලමිටෙන් එල්ල කළ ප්‍රහාරය නිසා එසේ වන්නට ඇතැයි පොලිසිය සැක කරයි.
රාත්‍රී 11 ට පමණ මෙම ඝාතනය සිදුව තිබෙන අතර සිද්ධියෙන් පසු සැකකරු කෙළින්ම ගොස් ඇත්තේ ඩී.එස්. සේනානායක වීදියටය. යාපනයේ සිට නුවරඑළිය බලා ගමන් කරන බස් රථයේ එල්ලී ඔහු කෙළින්ම ගොස් ඇත්තේ නුවරඑළියටය. බසයෙන් බැස ගත් විගස දුරකතනයේ සිම් කාඩ්පත් ගලවා ඉවත් කර නව දුරකතන අංකයක් ලබා ගන්නට ඔහු කටයුතු කරන්නේ දුරකතනය ඔස්සේ පොලිසිය හඹා එනු ඇතැයි සිතාය. එදින සිට අත්අඩංගුවට පත් වන පසුගිය 26 වන දින දක්වා ඔහු සිම් කාඩ්පත් හයක් පාවිච්චි කර තිබෙන බව පොලිසිය පවසයි. ඝාතනය සිදු කරන අවස්ථාවේ සැකකරු පාවිච්චි කළ දුරකතන අංකයේ දත්ත වාර්තාවක් ලබාගත් පොලිසිය ඔහු වැඩියෙන්ම ඇමතුම් ලබාගත් පුද්ගලයින් සම්බන්ධයෙන් විමසිලිමත් වූයේය. එම අංකවලට ඔහු කුමන හෝ මොහොතක කතා කරනු ඇතැයි පොලිසිය දැන සිටියේය. සිම් කාඩ්පත් මාරු කළ සැකකරු ඔහුගේ හිතවතෙකුට කතා කළේ මේ අවස්ථාවේදීය. ඒ ඔස්සේ ඔහු පසුපස හඹා ගොස් අත්අඩංගුවට ගැනීමට පොලිසිය සමත් විය.

සැකකරු නිතර මුහුණු පොතේ සැරිසැරුවෙකි. ඒ ඔස්සේ ඔහු කාන්තාවන් රැසක් සමග සම්බන්ධතා ගොඩනගාගෙන තිබූ බව පොලිස් පරීක්ෂණ මඟින් අනාවරණය වී තිබිණි. 2020 වසරේදී මරදාන පොලිස් බල ප්‍රදේශයේදී සිදු කළ ඝාතනයක ද සැකකරු වන ඊට අදාළ නඩුව විභාග වන අවස්ථාවේ වසර 2 1/2 ක කාලයක් රක්ෂිත බන්ධනාගාර ගතව සිට ඇත්තේ ඇප ලබා දීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම හේතුවෙනි. බන්ධනාගාරය තුළදී හඳුනාගත් පුද්ගලයකු නිදහස්ව ගොස් පසුව මොහුට ඇප ලබා දී තිබෙන බව පොලිසිය පවසයි. මොහු තම මිතුරා ඝාතනය කර ඇත්තේ එම සිද්ධියට අදාළ නඩුව මෙම මස 22 වැනි දින කැඳවීමට නියමිතව තිබියදීය.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය, නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී චමිල් රත්නායකගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරී ඉලංගකෝන්ගේ අධීක්ෂණයෙන් මහනුවර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක රසික සම්පත්, කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ඩී.එම්.එල්. බී දිසානායක, උපපොලිස් පරීක්ෂකවරුන් වන අබේරත්න, වික්‍රමසිංහ, සැරයන්වරුන් වන 32874 ජයවර්ධන, 46971 අතුල, කොස්තාපල්වරුන් වන 60703 චානක, 78462 සනත් යන නිලධාරීහු සිද්ධිය පිළිබඳ විමර්ශන සිදු කළහ

**ඡායාරූප-රුවන් මීගම්මන**

# තානායම් කාමරේ හඬා වැටුණු රෑමතිය

තානායම්පල්ලාගේ සාක්ෂිය

රන්ජන් ගාමිණී ජයවර්ධන

**"ට්‍රීක්... ට්‍රීක්..." "මැනේජර් මහත්තයා.. මම රෙස්ට් හවුස් එකේ දහඅට කාමරෙන් කතා කරන්නේ..." එම කාමරයේ ලැගුම් ගෙන සිටින්නේ අලෙවි විධායක නිලධාරියෙකි. ඇමතුම ලැබෙන්නේ ඔහුගෙනි.**

"මේ... මම කාමරේ බැල්කනියේ... සූම් කොන්ෆරන්ස් එකකට ලොග් වෙලයි හිටියේ. මට එක සැරේ විලාපයක් වගේ මහ සද්දයක් ඇහුණා අල්ලපු කාමරෙන්... ගෑනු මනුස්සයෙක් අඬ අඬා කාටදෝ මොකක්ද විස්තරයක් කියනවා වගේ..." අලෙවි විධායකයාගේ කතාවෙන් මම ගල්ගැහුණා සේ විය.

"පොඩ්ඩක් ඒ සද්දෙ නවත්තන්න බලන්න බොස්.. අපේ ෆොරින් ක්ලයන්ට්ස්ලාත් ඒ සූම් කන්ෆරන්ස් එකට ලොග් වෙලයි ඉන්නේ. ඉතින් ඒ වගේ සද්ද ඇහෙන එක හරි නෑ..." එසැණින් වේටර් නිශාන්ත මගේ කාමරයට ඇතුළු වුණා.

"ඔව් සර්... අවුල මේකයි... ඒ කෝල් කරපු කාමරේට අල්ලපු කාමරේ ඉන්නෙ ඊයෙ හවස ආපු කපල් එකක්... ඒකෙ මහත්තයා එළියට ගිහිල්ලාලු... මම කීවා ඒ ගෑනු කෙනාට දවල් එකොළහවත් වෙද්දි අපට කාමරේ අවශ්‍යයි කියලා... මෙන්න බොලේ එතකොට ඒ ගෑනු කෙනා මහා සද්දෙන් මට හැල්ලක් කියාගෙන අඬා වැටෙන්න පටන් ගත්තා... ඔව් සර්... ඒ ගෑනු කෙනා එක්ක ආපු මහත්තයා කවුදෝ මනුස්සයෙක් හම්බ වෙන්න උදේම බයික් එකෙන් පිටත් වෙලා ගියාලු... ඉතින් තාම ඇවිල්ලත් නැතිලු... දැන් ෆෝන් එකත් වැඩ නැතිලු... එහෙම කිය කියා මහ සද්දෙන් විලාප ගහන්න තියාගත්තා..."

"හරි ඔයා ආයෙමත් ගිහින් මම කීවය කියලා කියන්න.. අද දවල් ඉඳලා රෑ තුනකට වෙන කට්ටියක් ඔය කාමරේ මුදල් ගෙවලා රිසව් කරලා තියෙන නිසා අනිවාර්යයෙන් අපිට කාමරේ ඕනේ කියලා. මහත්තයා එන්න ලේට් වෙනවානම් කාමරෙන් චෙකවුට් වෙලා තානායමේ ලොබියෙ වාඩි වෙලා ඉන්න කියලාත් කියන්න..."

මගේ පණිවුඩය රැගෙන ආපසු හැරුණ නිශාන්ත විනාඩි දෙක තුනක් ගත වන්නට මත්තෙන් නැවත පැමිණියා.

"මාර වැඩේ සර්... ඒ ගෑනු මනුස්සයා කියනවා එයාගෙ අයියත් ත්‍රිවිල් ඩ්‍රයිවර් කෙනෙක් නිසා අයියා අඳුනන වීල් ඩ්‍රයිවර් කෙනෙක් එහෙම එයා තානායමේ වාඩි වෙලා ඉන්නවා දැක්කොත් විනාසයිලු..."

"ඒකත් එහෙමද...? එතැනදි ඉතින් අපිට කරන්න දෙයක් නෑ... උපරිමේ දවල් දොළහ වෙනකම් කාමරේ ඉන්න දෙන්නම් කියන්න..."

මම අවසන් නිවේදනය නිකුත් කළා.

"මාර වැඬේ නේ සර්... මම ඒ ටික කීවා. ඒ ගෑනු මනුස්සයා වැළහින්න වගේ ආයෙමත් අඬා වැටෙන්න ගත්තා.."

"එහෙම කියලා බෑනේ..." මමත් වේටර් නිශාන්තත් කාමර පරිශ්‍රය වෙත ඇවිද ගොස් දහඅට කාමරයේ දොරට තට්ටු කළා. දොර විවර වුණා. දුක් වින්ද සලකුණු සහිත මුහුණකින් හෙබි, පෑෂ්ටිමත් අඟපසඟකින් යුතු හතළිස් වැනි විය පසු නොකළ පෙනුමැති ගැහැනිය විමතිය රැඳි

## මැනේජර් මහත්තයා මම කතා කරන්නේ 18 කාමරෙන්, අල්ලපු කාමරෙන් ලොකු විලාපයක් ඇහෙනවා

දෑසින් මා දෙස බලා සිටියා.

"අපේ රෙජිස්ටරේ තියෙන ඔයාගෙ මහත්තයාගෙ නම සනත් නේද? කෝ එයා...?"

"අනේ ඔව් සර්... එයා උදේ හයට විතර කාමරෙන් පිටවෙලා බයික් එකෙන් ගියේ. මේ කිට්ටුව මුදලාලි කෙනෙක් හම්බ වෙලා එයා වැඩ ඉවර කරපු ගෙවල් වයරින් වැඩක සල්ලි වගයක් ඉල්ලගෙන එන්නය කියලා... අර බලන්න.. අද උදේට කාමරේට ගෙනැත් දුන්න කෑම... ඉතින් එයා උදේට කෑවෙ නැති නිසා මටත් කන්න විදියක් නෑ..."

"දැන් මේ උදේ කෑම නරක් වෙන්නත් ඇවිත් ඇති. මිස් මේ කෑම කාලා ඉන්න..." මම උපේක්ෂා සහගතව කීවා.

## කොට්ටෙ යට රුපියල් පන්දාහකුයි මෝටර් බයිසිකලේක ලයිසන් ඉන්ෂුවරන්ස් එකයි තියෙනවද බලන්න

"කන්න බෑ සර්... මම දැන් පැය ගාණක් තිස්සේ කෝල් ගහනවා. සනත් ෆෝන් එක ආන්සර් කරන්නෙත් නෑ..."

"හරි... අපි බලමු.. ඔයා අපිට දවල් දොළහටවත් කාමරේ බාර දෙන්න. අද අපේ කාමර ඔක්කොම කල්තියා බුක් වෙලයි තියෙන්නේ. මම ඒ බව ඔයාලාට කාමරේ දෙන වෙලාවෙදිත් කීවා..."

"..අනේ ඇයි ඔබතුමා මේ තනිවෙච්ච ගෑනියෙක්ව මෙහෙම එළවලා දාන්න හදන්නේ... අනේ මගේ ලොකු කෙල්ල මේ සැරේ උසස් පෙළ ලියනවා.. අතේ සත පහක් නෑ... ඔය සනත් කියන මනුස්සයා කාගෙන්දෝ සල්ලි වගයක් ඉල්ලලා දෙනවය කීව පොරොන්දුව නිසාමයි මං මේ රැය ගෙවන්න තානායමට ආවේ..."

"ට්‍රීක්... ට්‍රීක්..." සංවාදය අතරේම ඇගේ ජංගම දුරකතනය නාද වුණා.

"අම්මෝ ඇති... මෙන්න සනත් කතා කරනවා..." "හලෝ...සනත්... තමුන් කොහේද මේ වෙලාවෙ ඉන්නේ..?"

දුරකතනය එහා කෙළවරින් ඇසුණේ පුරුදු කටහඬ නොවේ.

"ආ...සනත් නෙමේද? එතකොට සනත්ගෙ ෆෝන් එකෙන් කතා කරන ඔයා මේ කවුද? කෝ අනේ සනත්? එයාට දෙන්නකෝ..." ගැහැනිය පින්සෙණ්ඩු වූවාය.

"සනත් මේ ළඟ ඉන්නවා. ඊට කලියෙන් කියන්න ඔයා දැන් කොහේද ඉන්නෙ...?"

"මං තානායමේනේ... එයා එනකම් උදේටත් නොකා මේ කාමරේට වෙලා බලා ඉන්නවා. ඔයා කවුද? අනේ සනත්ගේ ෆෝන් එක එයාට දෙන්නකෝ..."

"හරි... ඊට කලියෙන් බලන්න ඔය කාමරේ සනත් නිදාගත්ත කොට්ටෙ යට... පොඩි පාර්සලයක් තියෙනවද කියලා..." වේටර් නිශාන්තත් මමත් තක්බීර් වෙලා මේ වෙන්න යන දේ බලා හිටියා.

"තියෙනවා... තියෙනවා.. පන්දාහෙ කොළේකුයි. අයිඩින්ටියයි... ලයිසන් එකයි..තව... බයික් එකේ ඉන්ෂුවරන්ස් එකද කොහෙදයි.. මොනවද තව රිසිට් වගයකුයි.. අනේ ඉතින් දැන්වත් සනත්ට දෙන්නකෝ..."

"බීප්.. බීප්.. බීප්.."

"අයියෝ... මොකද්ද ඒ කළ බලු වැඩේ... අනේ සනාත්..." ගැහැනිය විලාප නගමින් හඬා වැටෙන්නට වුණා.

"සර්... සර්... ටක්ගාලා ඔෆිස් එකට යන්න... ලෑන්ඩ් ලයින් එකට කෝල් එකක්... ලොකු හදිසියක්ලු... ලයින් එකේ ඉන්නවා. කවුද කීවෙ නෑ..." පිළිගැනීමේ නිලධාරිනිය කාමරය අසලට දිවවිත් කීවා. මමත් නිශාන්තත් දහඅට කාමරයෙන් මගේ කාර්යාල කුටිය වෙත දිව ගියා.

"හලෝ... ඔව්... ඔව්..."

"රායිට්... මැනේජර් මහත්තයා. අපි පොලිසියෙන්... මීට පැය දෙක තුනකට කලින් ටවුමේ හාඩ්වෙයාර් කඩයක් ළඟ දෙන්නෙක් ගුටිබැට හුවමාරු කරගන්නා බවට වන් වන් නයින් ඇමතුමක් ආවා. ගිහින් බලද්දි කොන්ත්‍රාත්කාරයෙක් හාඩ්වෙයාර් මුදලාලි කෙනෙක් එක්ක සල්ලි චෙක් හුටපටේකට ගුටි ගහගෙන... කොන්ත්‍රාත්කාරයා උල් අයුධෙකින් හාඩ්වෙයාර් මුදලාලිට අනින්නත් හදලා... අපි ඒ කොන්ත්‍රාත්කාරයව ඇරෙස්ට් කළා. මෑන් බයික් එකකින් ආවට එයා ළඟ ලයිසන් ඉන්ෂුවරන්ස්වත් නෑ. මුලින්ම කීවෙ ඒවා කිසි දෙයක් තමාට නෑ කියලා.

පස්සෙදියි ඇත්ත කීවේ. ලයිසන් ඉන්ෂුවරන්ස් විතරක් නෙමෙයි එයා එක්ක ආපු ගෑනු කෙනත් තානායමේ ඉන්නවය කියලා. ඉතින් අපිට ඒ ගෑනු මනුස්සයාගෙනුත් සමහර විට ඔබතුමාගෙනුත් ප්‍රකාශ සටහන් කරගන්න තියෙනවා. අපි මේ දැන් එන ගමන්. එතකම් ඔය ගෑනු මනුස්සයට සිද්ධිය කියන්නත් එපා. ඒ මනුස්සයව යවන්නත් එපා." එසැණින් පොලිස් ජීප් රිය තානායම් මිදුලේ නතර වුණා. එහි පසුපස අසුණේ සිට බිමට බට පිරිමියාගේ දෑතේ මාංචු යුගලය තානායම් මිදුලේ දිවා හිරු රැසින් දිලිසුණා.

"කියන්න මේ තැනැත්තියගෙ සම්පූර්ණ නම..." පොලිස් නිලධාරියා කටඋත්තරය ලියාගන්නට සටහන් පොත දිග හැරියා.

"අනේ බුදු මහත්තයෝ... මගේ ලොකු දුව මේ සැරේ උසස් පෙළ ලියනවා..." ඇය නැගූ විලාපය පාළු තානායම් ආලින්දයේ දෝංකාර දුන්නා. පොලිස් නිලධාරියා ඒ හඬට සාවධානව සවන් දුන්නා.

"අපි සිදු කරන්නේ හාඩ්වෙයාර් හිමිකරුවෙකුත් කොන්ත්‍රාත්කරුවෙකුත් අතර ඇතිවූ ආරවුලක් පිළිබඳ විමර්ශනයක් විතරයි... එහිදී තමුන් මේ සිද්ධියට පැටළෙන්නේ සැකකරුගේ රියැදුරු බලපත්‍රය, වාහන රක්ෂණ සහතිකය, හැඳුනුම්පත ආදිය ගැටුම සිදුවන අවස්ථාවේ තමුන් භාරයේ තිබුණු නිසයි. ඒ නිසා අපේ දෙපාර්තමේන්තුව, උසස් පෙළ ලියන ඒ දරුවට කිසිදු අගතියක් සිදුවන්න ඉඩ තියන්නේ නෑ..." ඇගේ ඉකිබිඳුම කෙමින් නිවී ගියා.

එනිසාදෝ අපේ හිසට ඉහළින් කැරකෙමින් තිබූ තානායම් ආලින්දයේ සිවිලිම් විදුලි පංකාවේ හෝ හඬ අප කාටත් හොඳින් ඇසෙන්නට පටන් ගත්තා.





# මොනරාගල - කටුනායක ලංගම බසයේ කොන්දොස්තර මරුට බිලි කළ දේශපාලන සංවාදය

■ ටී.කේ.ජී. කපිල - කටුනායක

**'සරත් බණ්ඩාර' සහ 'අනුර පවන් කුමාර' සමීප එසේම කල්‍යාණ මිත්‍රයෝය. ඔවුන් දෙදෙනාම මොනරාගල, දඹගල්ල ගමේ පදිංචිකරුවන් වීම එම බැඳීම වඩාත් දැඩි කර තිබුණි. මේ දෙදෙනා කටුනායක සිට මොනරාගල දක්වා ධාවනය කෙරෙන ශ්‍රී ලංගම බස් රථයේ රියැදුරු සහ කොන්දොස්තර ලෙස වසර ගණනාවක සිට කටයුතු කරමින් සිටියහ. 36 හැවිරිදි කොඩිකාර මුදියන්සේලාගේ 'සරත් බණ්ඩාර' මොනරාගල කටුනායක බසයේ රියැදුරුවරයා ලෙස සේවය කළ අතර ඔහු දෙදරු පියෙකි. 38 හැවිරිදි විජේසිංහ මුදියන්සේලාගේ අනුර පවන් කුමාර එම බස් රථයේ කොන්දොස්තර ලෙස සේවය කළ අතර ඔහු සිය විවාහ ජීවිතයේ දිගු කලකට පසුව පස් මස් වියැති සිඟිත්තෙකුගේ පියෙකු වී සිටියේය.**

මොනරාගල සිට අලුයම පහට කටුනායක බලා පිටත්වන මෙම බස් රථය සවස 02.30 වන විට කටුනායකට ළඟා වේ. සියලු මගීන් බසයෙන් බැසීමෙන් පසුව රාත්‍රී නවාතැන් ගැනීම සඳහා කටුනායක 'වලානගොඩ සුමනාරාම විහාරස්ථානය'ට මේ දෙදෙනා යන්නේ එම බසයද රැගෙනය.

ඉන් පසුව ඔවුන් දෙදෙනා බසය සෝදා පිරිසිදු කර තම රෙදිපිළි ද සෝදා දිය නෑමෙන් අනතුරුව රාත්‍රී ආහාරය පිළියෙල කර අනුභව කිරීම සිදු වේ. පසුව රාත්‍රී නින්දට වැටෙන්නේ පසු දින අලුයම මොනරාගල බලා යෑමේ අරමුණෙනි. එදින ද 'සුපුරුදු දින චර්යාව' අනුගමනය කළ මේ දෙදෙනා ආහාර පිළියෙල කරන අතර, ආහාර පිසෙන තෙක් මද්‍යසාරයෙන් සප්පායම් වීමට ද පටන්ගෙන තිබුණි.



උප පොලිස් පරීක්ෂක මොහොමඩ් නිෂ්මි

ඉකුත් 23 වැනිදා රාත්‍රී 07.30 පමණ වන විට දෙදෙනා මත්පැනින් හොඳින් සන්තර්පණය වී සිටි අතර ඔවුන් අතර 'දේශපාලන සංවාදයක්' ද ආරම්භ වී තිබුණි. ක්‍රමයෙන් එය 'උත්සන්න' වීමත් සමඟ දෙදෙනා කලහකාරී ලෙස හැසිරෙන්නට පටන් ගත්තේ එක්වරමය.

ආරවුල උත්සන්න වීමත් සමඟ ඔවුන් පානය කරමින් තිබූ මත්පැන් බෝතල් දෙකක් පොළොවේ ගසා එකිනෙකාට ඇන ගැනීමට තැත් කර ඇති අතර එහිදී රියැදුරු සරත් බණ්ඩාර විසින් ද

## ගමන් සගයාට බෝතලයක් කඩා ඇන්න රියැදුරා ඇවරිවත්තේදී අල්ලයි

බෝතල් පහරක් කොන්දොස්තර පවන් කුමාරගේ ගෙල ප්‍රදේශයට එල්ල කර ඇත්තේ එක් වරමය.

## පොලිසියට පැමිණිල්ලක් කර රෝහල්ගත වූ කොන්දොස්තර රෝහලේදී මිය ගිහින්

එයින් තුවාල ලැබූ කොන්දොස්තර පවන් කුමාර කටුනායක පොලිසිය වෙත පැමිණ සිදු වූ සියල්ල පවසා කටුනායක පොලිසියේ පැමිණිල්ලක් සිදු කිරීමෙන් අනතුරුව මීගමුව මහ රෝහල වෙත වැඩිදුර වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඇතුළු වී තිබේ.

පසු දා, එනම් පසුගිය 24 වැනිදා පහන් වී හෝරා කීපයක් ගතවත්ම මීගමුව මහ රෝහලෙන් කටුනායක පොලිසියට ලැබුණේ අසුබ ආරංචියකි. ඒ ඊට ස්වල්ප මොහොතකට පෙර මොනරාගල බස් රථයේ කොන්දොස්තරවරයා ලෙස සේවය කළ අනුර පවන් කුමාර මිය ගිය බවයි. ඒ අනුව මේ පුවතට මාධ්‍ය මඟින්ද මහත් ප්‍රචාරයක් ලැබිණි.

තොරතුර ලද සැණින් ක්‍රියාත්මක වූ කටුනායක පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ උප පොලිස් පරීක්ෂක මොහොමඩ් නිෂ්මි ඇතුළු නිලධාරීන් පිරිස බසයේ රියැදුරු සරත් බණ්ඩාර සොයා කටුනායක වලානගොඩ විහාරස්ථානය වෙත යෑමට පිටත් වූ අතර, එහිදී ඔවුන්ට ලද 'බුද්ධි තොරතුරක්' අනුව ඒ වන විටත් කටුනායක ප්‍රධාන බස් නැවතුම්පොළ වෙත පැමිණ සිටි සරත් බණ්ඩාර අත්අඩංගුවට ගැනීමට හැකි වී තිබුණි.

සරත් බණ්ඩාර එසේ කටුනායක ප්‍රධාන බස් නැවතුම්පොළ වෙත පැමිණ සිටියේ මිතුරා වන කොන්දොස්තර පවන් කුමාර බැලීමටද, නැතිනම් මේ පුවත දැනගත් සැණින් ප්‍රදේශයෙන් පලා යෑමට ද යන්න පිළිබඳව සෙවීමට කටුනායක පොලිසිය විමර්ශන ආරම්භ කර තිබේ. කටුනායක පොලිසිය මෙම සිද්ධිය පිළිබඳව කීප දෙනෙකුගෙන්ම සාක්ෂි සටහන් කර ගෙන ඉදිරි විමර්ශන කටයුතු සිදු කරමින් සිටියි.

මොනරාගල බසයේ රියැදුරු සරත් බණ්ඩාරගේ බිරිය සහ දරු දෙදෙනාද මොනරාගල බස් ඩිපෝවේ අධිකාරීවරයා ඇතුළු එම ඩිපෝවේ උසස් නිලධාරීන් පිරිසක් පසුගිය 25 වැනිදා කටුනායක පොලිසිය වෙත පැමිණ සිටියේය.

එහිදී ඩිපෝ අධිකාරීවරයා සඳහන් කළේ සෑම දිනකම මොනරාගල සිට කටුනායකටත්, කටුනායක සිට මොනරාගල දක්වාත් බස් රථ දෙකක් ධාවනය සඳහා යොදවා ඇති අතර, ඉන් එක් බස් රථයකින් රුපියල් ලක්ෂ එකහමාරක පමණ මුදලක් සිය ඩිපෝවට ආදායම් සේ ලැබෙන බවයි. මේ සිද්ධිය ගැන ඔහුද දැඩි ලෙස කම්පාවට පත්ව සිටියේය.



අනුර පවන් කුමාර

මොනරාගල බසයේ රියැදුරු සරත් බණ්ඩාර කටුනායක පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර, කොන්දොස්තර අනුර පවන් කුමාරගේ ඝාතනය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණයක්ද පැවැත්විණි.

මීගමුව පොලිස් අධිකාරී එරික් පෙරේරාගේ උපදෙස් පරිදි කටුනායක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අජිත් නිශ්ශංකගේ මෙහෙයවීමෙන් අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සුජීව කුමාර සුදුසිංහ, උප පොලිස් පරීක්ෂකවරුන් වන මොහොමඩ් නිෂ්මි සහ සජිත්, සැරයන් 37371 සුනිල්, කොස්තාපල් 33249 අනුෂ්ක යන නිලධාරීන් විසින් විමර්ශන සිදු කරන ලැබිණි.

## කන - බොන අතරේ ඇති වූ ආරවුලක්




දෙදෙනා සේවය කළ මොනරාගල - කටුනායක බස් රථය

# ලක්මව රනින් සැරසූ ඉංගිරියේ පොලිස් දියණිය

## ඉන්දියා ශ්‍රී ලංකා මාස්ටර් මලල ක්‍රීඩා උලෙළේ රන් පදක්කම් 4ක් රටට දිනා දෙයි

## කොස්තාපල් 7578 ජේ.එම්. නිර්මලා සුභාෂිණී ජයවර්ධන ක්‍රීඩාවෙන් ලැබූ ජයග්‍රහණ අපමණකි

■ ප්‍රියදර්ශනී කහවල
ඉංගිරිය මධ්‍යම සමූහ

**පොලිසිය පැමිණිලි විභාගයට වෙන්වූ නීතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු අපරාධකරුවන් අත්අඩංගුවට ගෙන දඬුවම් ලබා දෙන ආයතනයක් පමණක්ය යන හුදු මතය ගම් මට්ටමින් පමණක් නොව නගර මට්ටමින්ද තවමත් දුරලිය නොහැකි තරමට ඔඩු දිවූ සංකල්පයක් වී හමාරය. පොලිසියේද සිටින්නේ මනුෂ්‍යයින් බව බොහෝ දෙනෙකුට අමතකව තිබීම මෙම දුර්මතයට ප්‍රධානතම හේතුව බව අවිවාදයෙන්ම පිළිගත යුතුව තිබේ.**

ඉතා කලාතුරකින් මනුෂ්‍යයෙකුට පිහිටන අපූර්ව වූ දක්ෂතාවන් පොලිසියේ සිටින එවන් මනුෂ්‍යයින්ටද පිහිටා තිබිය හැක. නමුත් එවන් හැකියාවක් උරගා බැලීමට සමාජයේ නිදහසේ වෙසෙන ඔබට මට මෙන් නීතිය ක්‍රියාත්මක කරන පොලිසිය වැනි ආයතනයක රාජකාරි කරන්නෙකුට නිදහසක් නොමැත. විසිහතර පැයේම මහජන ආරක්ෂාව වෙනුවෙන් සේවයට කැපව සිටින ඔවුහු තමන් සතු හැකියාවන් උපන් ගෙයිම වළලා, ඒ සියල්ල අමතක කර රාජකාරිය වෙනුවෙන් කැප වෙති.

රාජකාරි ස්ථානයේ ප්‍රධානීන්ගෙන් ලද නොමඳ සහාය හේතුවෙන් පසුගියදා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්වුණු 'ඉන්දියා - ශ්‍රී ලංකා මාස්ටර් මලල ක්‍රීඩා උලෙළේදී' ප්‍රබල ඉන්දියාව පරාජය කරමින් තමන් සහභාගි වූ සියලු තරග ඉසව්වලින් රන් පදක්කම් හතරක් දිනා ගනිමින් මෙරටට අතිමහත් වූ කීර්තියක් ගෙන ඒමට පොලිස් කොස්තාපල්වරියක් සමත් වූවාය.

ඉංගිරිය, බොරළුගොඩ පිටිසර ග්‍රාමයේ පදිංචිව ඉංගිරිය පොලිසිය නියෝජනය කරමින් මෙලෙස තරග බිමට ගොස් සුවිසල් ජයග්‍රහණයක් ලබා ගත් ඇයට රතු පලස් පාවඩ එළීමට කිසිවෙකුත් ඉදිරිපත් නොවුවද සැබැවින්ම ඇය ලබාගත් ජයග්‍රහණය සමස්ත පොලිස් දෙපාර්තමේන්තුවටම මහත් වූ අභිමානයකි.

ඇය නමින් ඉංගිරිය පොලිසියේ කොස්තාපල් (7578) ජේ.එම්. නිර්මලා සුභාෂිණී ජයවර්ධනයි. අවුරුදු 30 - 35 වයස් කාණ්ඩයෙන් තරග වැදුණු ඇය සහභාගි වූ තරග ඉසව් ගණන හතරකි. මීටර් 100 සහ මීටර් 200 දිවීම, දුර පැනීම මෙන්ම තුන් පිම්ම යනාදී ලෙස ඇය සහභාගි වූ ඉසව් හතරෙන්ම රන් පදක්කම් දිනා ගැනීම සැබැවින්ම පොලිස් දෙපාර්තමේන්තු ඉතිහාසය අලුත් කරවමින් තැබූ ඉතිහාසගත වාර්තාවකි. ගෙල රන් පදක්කමින් සරසා ගැනීමට තරම් ඇය වාසනාවන්ත වූවද නිර්මලා මෙතෙක් පැමිණි දුර රන් මාලා පැලඳ, රෝස මල් ඇතිරූ මාවතක පැමිණි ගමනක් නම් නොවේ.

"මම මේ රන් පදක්කම් ගත්තේ මාව පුහුණු කරපු සර්ගෙ සපත්තු දෙක දාගෙන දුවලා...." ඇය පවසාලූ වදන් පෙළ කාරුණික හදවත් ඇත්තන්ගේ හද ගැස්ම මොහොතකට නතර කිරීමට තරම් සමත්ය. එවන් දුෂ්කරතා මැද කටු කොහොලින් පිරි දුෂ්කර මාවතක් ජය ගත් ඇයගේ උපන් ගම අනුරාධපුර, මහවිලච්චියයි.

"මගේ තාත්තා නෑ. පුංචි කාලෙම නැති වෙලා. මගෙ අම්මා තමා මගෙ හැමදේටම පස්සෙන් හිටියේ..." නිර්මලා සිය කතාව ආරම්භ කළේ එලෙසිනි.

අනුරාධපුර, මහවිලච්චිය තක්ෂිලා මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූ නිර්මලා පහ වසර ශිෂ්‍යත්වයෙන් පසුව ක්‍රීඩා අංශයෙන් පාසලට නැතුවම බැරි චරිතයක් වූයේ පය තබන තබන සියලු තරග ඇය ඉහළින්ම ජයගත් බැවිනි. පාසල් අධ්‍යාපනයෙන් පසු 2010 වසරේදී ආධුනික කොස්තාපල්වරියක ලෙස කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයට ඇතුළත් වූ ඇය අවුරුදු තුනක් එහි ලැබූ මූලික පුහුණුවෙන් පසු ගාල්ල නාගොඩ පොලිසියට අනුයුක්ත කළාය. සුළු කාලයකට පමණක් නාගොඩට සීමා වූ ඇගේ සේවා ජීවිතයේ නව පිටුවක් පෙරළුණේ ජනාධිපති ආරක්ෂක අංශයේ ක්‍රීඩා අංශයට ඇතුළත් වීමෙන් පසුය. වසර හතරක් අවසානයේ 2014 වසරෙහිදී සිය උපන් ගම වූ විලච්චිය පොලිසියට ස්ථාන මාරුවීම් ලද නිර්මලා සිය ක්‍රීඩා ජීවිතයට එතැනින් තාවකාලික විරාමයක් තැබුවාය. ගංජා ඇතුළු මත්ද්‍රව්‍ය, නීති විරෝධී මත්පැන්,


ඉන්දියාව පරදා ඇය ලැබූ ජයග්‍රහණයට පදක්කම් ලබාගත් ආකාරය

කාන්තා අතවර සිද්ධීන් ඇතුළුව එහිදී ඇය විසින් විමර්ශනයට දායක වූ අපරාධ සිදුවීම් රැසකි.

තම උපන් හැකියාවට තිත තබමින්, උපන් ගමේ නීතිය සාධාරණය වෙනුවෙන් කැපවීමක් කළ ඇය 2019 වසරේදී පොලිස් ශිෂ්‍යභට කණ්ඩායමේ උපදේශකවරියක් ලෙස කටයුතු කළාය. එහි අවුරුද්දක සේවා කාලයකින් පසු කළුතර කොට්ඨාසයේ තෙබුවන පොලිසියට මාරුවීම් ලද නිර්මලා 2020 දී සිය දිවි ගමනේ නව පිටුවක් පෙරළුයේ ඉංගිරිය පොලිසියට ස්ථාන මාරුවීම් ලැබීමෙන් පසුවය.

වසර ගණනාවක් නවතා තිබූ ඇගේ ක්‍රීඩා කටයුතු නැවත ආරම්භ වූයේ එතැන් සිටය. නිර්මලා සතු අපූර්ව වූ ක්‍රීඩා කුසලතාවන් මනාව හඳුනාගත් පාණදුර කොට්ඨාස භාර ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී සමන්ත වෙදගේ ඒ පිළිබඳව හොරණ සහකාර පොලිස් අධිකාරී උදයකුමාර දැනුවත් කිරීමට කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇයට නැවත ක්‍රීඩා පුහුණුවීම්වල නිරත වීමට අවස්ථාව ලැබුණි.

වත්මන් ඉංගිරිය පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත චන්ද්‍රපාලගෙන්ද ඒ සඳහා ඇයට ලැබෙන්නේ මහත් අනුබලයකි. පසුගියදා ඇය අප රටට ලබා දුන් කීර්ති ප්‍රශංසා සියල්ල හිමි වීමට රාජකාරි ස්ථානයේ ප්‍රධානීන්ගෙන් ඇය ලද අනුග්‍රහය ප්‍රබල සාධකයක් බව සඳහන් කළ යුතුමය.

නිර්මලා සිය ක්‍රීඩා පුහුණු වීම් සිදු කරනුයේ පාණදුර නගර සභා ක්‍රීඩාංගණයේය.

එලෙස පුහුණුවීම් කිරීමට අවශ්‍ය 'ඩෙක්ෂූස්' වර්ගයේ සපත්තු ඇයට නොමැත. එසේම තරග සඳහා සහභාගි වූ විට භාවිත කෙරෙන විශේෂිත සපත්තු යුගලක්ද ඇයට නැත.

"ඒ එක සපත්තු ජෝඩුවක් රුපියල් තිස්දාහක් විතර වෙනවා. තරගවලට ගියාම දුවද්දි දාන්න සපත්තු දෙක මට දෙන්නෙ මට පුහුණුවීම් කරන සර්..." කළුතර පොලිස් කොට්ඨාසයේ විශේෂ කාර්යාංශයේ කළුතර දිස්ත්‍රික් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සොයිසා ඇගේ පුහුණුකරුය. පසුගියදා ඉන්දියාව පරදා ඇය ජයග්‍රහණ ලබා ගත්තේ ඔහු ලබා දුන් පාවහන් යුගල පැළඳය. "ඒ වගේම ඉංගිරිය පොලිසියට අනුයුක්ත පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ උප පොලිස් පරීක්ෂක නිමල්සිරි සර්ගෙනුත් මට ලැබෙන්නෙ පුදුමාකාර සහයෝගයක්. මේ හැමෝම රාජකාරි වේලාවේදී මට උදවු කරනවා වගේම ගෙදරදී මගෙ සැමියාගෙන් මට ලැබෙන්නෙ වචනයෙන් කියන්න බැරි තරම් සහයෝගයක්..." නිර්මලා පැවසුවේ සිනාවකින් මුව සරසාගෙනය.


හොරණ සහකාර පොලිස් අධිකාරී උදයකුමාර විසින් නිර්මලා ජයවර්ධනට සුබපැතුම් පිරිනමමින්

මෙම ජයග්‍රහණයට අමතරව ඇය විසින් ලබාගත් ජයග්‍රහණ රැසකි. ඉන් ප්‍රධාන පෙළේ ජයග්‍රහණ ගැන සඳහන් කළහොත් 2010 වසරේදී පැවති එල්.එස්.ආර්. කලම්බෝ මැරතන් තරගයේ රටවල් 14ක් පරදා ඇය ප්‍රථම ස්ථානය ලබා ගත්තාය. එහිදී කිලෝ මීටර් 21ක් දුර දිව ගොස් ජයග්‍රහණය හිමිකර ගත් ජයවර්ධන හා දෙවන ස්ථානය දිනාගත් බෙල්ජියම් ක්‍රීඩිකාව අතර පැයකුත් විනාඩි 20ක වාර්තාගත කාල අන්තරයක් පැවතීම විශේෂයෙන් කැපී පෙනුණු කරුණක් විය.

2009 වසරේදී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු තරගාවලියේදී මීටර් 1500, මීටර් 5000 සහ මීටර් 10,000 යන තරග ඉසව් තුනෙන්ම ඇය දෙවන ස්ථානය දිනාගත්තාය. එසේම පොලොන්නරුවේ පැවති කාල්ටන් මැරතන් තරගයෙන් නිර්මලා දෙවන ස්ථානයත්, 2022 දෙසැම්බර්හිදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ පැවති රාජ්‍ය සේවා ක්‍රීඩා උලෙළේදී දුර පැනීම, තුන් පිම්ම යන ඉසව්වලින් තෙවන ස්ථානයත්, මීටර් 400 තරගයෙන් දෙවන ස්ථානයත් හිමි කර ගත්තාය.

"මම ඉන්දියාව පරද්දලා ගත්ත ජයග්‍රහණෙන් මට අවස්ථාවක් ලැබුණා එන පෙබරවාරි 10 ඉඳලා 13 වෙනකල් ඉන්දියාවේ බැංගලෝර්වල පැවැත්වෙන ප්‍රවීණයින්ගෙ මලල ක්‍රීඩා උලෙළට සහභාගි වෙන්න. ඒත් ඒකට යන්න ටිකට් එකම ලක්ෂෙකට වැඩියි...." නිර්මලා පැවසුවේ සුසුමක්ද හෙළමිනි.

පුහුණුකරුගේ සපත්තු යුගලෙන් තරග කළ, පුහුණුවීම් අතරතුර දැමීමට සුදුසු සපත්තු යුගලක්ද නොමැති, සුපිරි පෙළේ ධනවත් ක්‍රීඩකයින් ගන්නා පෝෂණ අතිරේක පවා අහිමි නිර්මලාගේ බැංගලෝර් සිහිනය මල්ඵල ගැන්වීමට සමත් අයෙකු වේ නම් එය සැබවින්ම මහත් සද් ක්‍රියාවක් සේම අප මවුරට ලබන මහත් භාග්‍යයක් බව සඳහන් කිරීම වටී.


කොස්තාපල් (7578) ජේ.එම්.එන්.එස්. ජයවර්ධන



පුපුරන ද්‍රව්‍ය තොගය සඟවාගෙන රැගෙන ආ ලොරියේ තට්ටුව



පුපුරන ද්‍රව්‍ය තොගය රැගෙන ආ ලොරි රථය

# වාරියපොළින් මන්නාරමට පන්නන්න ගිය පුපුරණ ද්‍රව්‍ය ලොරිය ඇල්ලූ ‘පොලිස් නුවණ’

## ලොරිය ඇතුළේ රහස් කුටියක ඩෙටනේටර් සේවා නූල් සහ පුපුරන ද්‍රව්‍ය

■ **මිහිර විජේසේකර** – මාරවිල සමූහ



**පොලිස් නිලධාරීන් සූක්ෂ්මව සිය බුද්ධිය මෙහෙයවා සිදු කරන රාජකාරිවලදී අනාවරණය කර ගැනීමට හැකි වන අපරාධ මෙපමණකැයි කියා ගණනය කළ නොහැකිය. බොහෝ විට සමස්ත සමාජයටම පොලිසියේ රාජකාරියේ ඇති වැදගත්කම දැනෙන්නේ යම් දෙයක් සිදු වීමට පෙර හෙළිකර ගන්නා අනාවරණ තුළිනි. අපරාධ බොහෝ විට අනාවරණය කර ගැනීමට හැකි වන්නේ රාජකාරියේ නිරත පොලිස් නිලධාරියාගේ සූක්ෂ්ම බුද්ධිය නිසාය. සරලව කිවහොත් යම් අපරාධයක් හඳුනා ගැනීමේ ඉව පොලිස් නිලධරයනට ලැබෙන්නේ පුහුණුව නිසාය.**

මේ එවන් ඉවක් ඇති පොලිස් නිලධාරීන් පිරිසක් සූක්ෂ්මව සිදු කළ විමර්ශනයකදී අත්කර ගත් සාර්ථක ප්‍රතිඵලයක් ගැන කියැවෙන කතාවකි.

කුලියාපිටිය පොලිස් කොට්ඨාසයට අයත් බිංගිරිය පොලිසියේ ස්ථානාධිපති හැරිසන් සෝමසිරි ඉකුත් 23 වැනිදා කුරුණෑගල හලාවත ප්‍රධාන මාර්ගයේ 'විලත්තව' මාර්ග බාධකයේ රාජකාරිය සඳහා ස්ථානගත කරන්නේ සැරයන් 49141 ඩබ්ලිව්. කේ.ඒ. ජූඩ් සම්පත් ඇතුළු පොලිස් නිලධාරීන් තිදෙනෙකි. සැරයන් ජූඩ් සම්පත් කෙනකුගේ හැසිරීම් රටාව දිහා බලා හා සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම්වලදී ඔවුන්ගේ හැසිරීම් රටාව ඉතා සූක්ෂ්මව අධ්‍යයනය කළ හැකි දක්ෂ නිලධරයෙකි. ඔහු මීට පෙර සිදු කළ විමර්ශන කීපයක් ද ඉතා සාර්ථක වූයේ ඒ නිසාය.

මෙම පොලිස් නිලධාරීන් මෙසේ විලත්තව පොලිස් මාර්ග බාධකයේ රාජකාරියේ නිරතව සිටියදී එදින මධ්‍යම රාත්‍රී 12.22 ට පමණ කුරුණෑගල දිසාවේ සිට හලාවත දක්වා ගමන් ගන්නා කුඩා ලොරියක් නවත්වන ලෙස සංඥා කෙළේ එය පරීක්ෂා කිරීම සඳහාය.

පොලිස් නිලධාරීන්ගේ ඒ අණත් සමඟ ලොරිය නවත්වා කඩිනමින් එහි රියැදුරු සහ සහායක පොලිස් නිලධාරීන් දෙසට ආවේ රියැදුරු බලපත්‍රය ඇතුළු අදාළ ලියකියවිලි රැගෙනය. ඔවුන් එලෙස පැමිණෙන්නේ තමන් හදිසි රාජකාරියකට යන බව පොලිස් නිලධාරීන්ට ඒත්තු ගන්වමිනි.

මේ අයගෙන් ප්‍රශ්න කිරීමටත් පෙර ඔවුන් ඉස්සර වීම ද පොලිස් නිලධාරීන්ගේ සැකයට තුඩු දෙන කරුණක් විය.

“අපි සර් මේ වුවමනාවකට වාරියපොළට ගියා... හලාවත හරහා මන්නාරමට යන ගමන්. මේ මගේ ලයිසන් එක. මේ ආදායම් බලපත්‍රය” නොනවත්වා එක දිගට එසේ කියමින් අදාළ ලියකියවිලි එකිනෙක පොලිස් නිලධාරීන් වෙත ලබා දීමට ලොරි රථයේ රියැදුරු වහ වහා කටයුතු කළේය.

ලොරි රියැදුරුගේ හැසිරීම් රටාව දිහා ඉතා ඕනෑකමින් බලා සිටි සැරයන් ජූඩ් සම්පත්ට මේ දෙදෙනා ගැන දැඩි සැකයක් මතු විය. පසුව නැවතත් ඔවුන් දෙදෙනා වෙන් වෙන් වශයෙන් ගෙන ප්‍රශ්න කිරීමට කටයුතු කළ සැරයන් ජූඩ් සම්පත් ඇතුළු පොලිස් නිලධාරීන් මේ දෙදෙනාගේ ප්‍රකාශ එකිනෙකට පරස්පර වීම



## රියැදුරුගේ 'හදිසිය' නිසා ගෝලයාටත් මාංචු වැටෙයි

හේතුවෙන් ලොරිය පරීක්ෂා කිරීමට කටයුතු කළේය.

ලොරියේ පිටුපස තට්ටුව ඉතා ගනකම් යකඩවලින් සාදා තිබුණ අතර එය තවදුරටත් පරීක්ෂා කිරීමේදී එම තට්ටුව සහ ලොරියේ සැකිල්ල අතර කිසියම් පරතරයක් තිබෙන බව පොලිස් නිලධාරීන්ට හඳුනා ගැනීමට ලැබිණි. අනතුරුව දැඩි පරිශ්‍රමයක් යොදා එම යකඩ තට්ටුව එසවීමට පොලිස් නිලධාරීන් කටයුතු කරන ලදි. එහිදී නිලධරයනට දැකගත හැකි වූයේ ලීවලින් සැකසූ කුඩා ප්‍රමාණයේ කුටිවල පුපුරන ද්‍රව්‍ය තොගයක් සඟවා තිබෙන බවය. ඉතා සුරක්ෂිත ලෙස එම පුපුරන ද්‍රව්‍ය එහි ගබඩා කර තිබිණි.

'ජෙලටිනයිට්' නමැති අධි බලැති පුපුරණ ද්‍රව්‍ය පිරවූ අඟල් අටක් දිග සහ වට අඩි තුනක ප්ලාස්ටික් බට අසූ නවයක්, පිපිරවීම් සඳහා යොදා ගන්නා 'සේවා නූල්' අඩංගු ඇසුරුම් විසි එකක්, බෝම්බ පිපිරීම් සඳහා ගන්නා විද්‍යුත් ඩෙටනේටර් නවසීයක් අඩංගු පෙට්ටි නවයක් මෙම රහස් කුටිය තුළ ඉතා සූක්ෂ්ම ලෙස සඟවා තිබියදී සොයා ගැනීමට හැකි විය.



ප්‍රධාන පොලිස් පරීක්ෂක හැරිසන් සෝමසිරි



අත්අඩංගුවට ගත් ජෙලටිනයිට් තොගය

## මාළු මරන්න ගෙන යනවා කී කතාව බොරුවක්

අනතුරුව පොලිස් නිලධාරීන් මේ සම්බන්ධව බිංගිරිය පොලිස් ස්ථානාධිපති හැරිසන් සෝමසිරිට දැනුම් දීමෙන් පසු පොලිස් කණ්ඩායමක් එහි පැමිණ පුපුරණ ද්‍රව්‍ය තොගය, ලොරිය සහ සැකකරුවන් බිංගිරිය පොලිසියට රැගෙන ගොස් විමර්ශන සිදු කිරීමට කටයුතු කළහ. පසුව සැකකරුවන් දෙදෙනාගෙන් ප්‍රශ්න කිරීමේදී ඔවුන් කියා සිටියේ මන්නාරම ප්‍රදේශයේ ධීවරයින් සඳහා මෙම පුපුරන ද්‍රව්‍ය රැගෙන ගොස් අලෙවි කරන බවය.

මෙම පුපුරණ ද්‍රව්‍ය රැගෙන එන්නේ වාරියපොළ ප්‍රදේශයෙන් බවට ද හලාවත ඔස්සේ මන්නාරමට ගමන් කිරීමට සූදානමින් සිටි බව ද මෙහිදී හෙළි විය. කෙසේ වෙතත් මේ සම්බන්ධව දිගින් දිගටම ප්‍රශ්න කිරීමේදී අනාවරණය වූයේ මීට වසර කීපයකට පෙර ගල්ගමුව ප්‍රදේශයේදී



වැටලීම සිදු කළ නිලධාරීන් කණ්ඩායම

මෙවැනිම ආකාරයට පුපුරන ද්‍රව්‍ය තොගයක් ප්‍රවාහනය කිරීමේදී පොලිසිය විසින් මොවුන් අත්අඩංගුවට ගෙන ඇති බවයි.

විමර්ශන නිලධාරීන් පවසන්නේ ලොරිය ඇතුළත ඉතා සූක්ෂමව මෙසේ පුපුරන ද්‍රව්‍ය රැගෙන යාම සම්බන්ධයෙන් මේ කියන කතාව පිළිගැනීමට නොහැකි බවයි. පුපුරන ද්‍රව්‍ය මසුන් මැරීමට යොදා ගන්නා බව ප්‍රකාශ කළේ සැකකරුවන් විසිනි. සැකකරුවන් දෙදෙනා මන්නාරම සිලාවතුර ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර ඔවුහු අවුරුදු 33 සහ 34 වියේ පසුවන්නෝ වෙති.

ඉදිරි විමර්ශන සඳහා සැකකරුවන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ අතර සැකකරුවන් පැය 72 ක රැඳවුම් නියෝග මත ප්‍රශ්න කිරීමට කටයුතු කරන බව බිංගිරිය පොලිස් ස්ථානාධිපතිවරයා සඳහන් කළේය.

කුලියාපිටිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නෙරන්ජන් අබේවර්ධන සහ සහකාර පොලිස් අධිකාරී අබේරත්නගේ උපදෙස් මත බිංගිරිය පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක හැරිසන් සෝමසිරිගේ මෙහෙයවීමෙන් සැරයන්වරුන් වන 49141 ඩබ්ලිව්.කේ.ඒ ජූඩ් සම්පත්, 68428 බණ්ඩාර, පොලිස් කොස්තාපල්වරුන් වන 95296 කරුණාරත්න, 32272 ප්‍රභාත්, 86113 මුතුනායක යන නිලධාරහු විමර්ශන කටයුතු සිදු කරති.

■ අමිල මලවිසූරිය

# අනේ! මගේ නඩුව අසනු

## දැරියක් රවටා කළ අපරාධය

**බිළිඳු කලලයක් විනාශ කිරීම හෙවත් 'ගබ්සාව' මෙරට නීතිය අනුව අපරාධයකි. එසේත් නැත්නම් මනුෂ්‍ය ඝාතනයකි. එහෙත් ඇතැමුන් ගබ්සාවට අනුබල දෙන්නේ නැතිනම් එවැනි අපරාධ සිදු කරන්නේ අමනුෂ්‍යයන් විලසිනි. එවැනි ළාබාල යුවතියකට සිදු කරන ලද ගබ්සාවක් පිළිබඳ ආන්දෝලනාත්මක පුවතක් ගෙවුණු සතියේ වාර්තා වූයේ මාතර පොලිස් කොට්ඨාසයෙනි.**

මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර පොලිස් වසමට අයත් හුලංදාව ප්‍රදේශයේ හෝටලයකදී පස් මස් බිලිඳු කලලයක් ළාබාල යුවතියකගේ ගර්භාෂයෙන් එළියට ගෙන දෙයියන්දර නිවෙසක ඉඩමක වළ දමා තිබියදී පසුගිය 17 වැනිදා මාතර කොට්ඨාස ළමා සහ කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශ නිලධාරින් විසින් දෙයියන්දර මහේස්ත්‍රාත්වරිය ඉදිරියේදී එම ස්ථානයේ කැණීම් කෙරිණි. වයස අවුරුදු 21ක යුවතියකගේ ගර්භාෂයෙන් එම පස් මස් බිලිඳු කලලය ඉවත් කිරීමේ අපරාධය සිදු කොට තිබුණේ 2022 වසරේ පෙබරවාරි මස 07 වැනිදා රාත්‍රියේය.

එලෙස වළ දමා තිබූ එම කලලය සොයා ගනිමින් ඊට සම්බන්ධ තරුණියගේ අනියම් සැමියා සහ වෛද්‍යවරයෙක් ලෙස පෙනී සිටි පුද්ගලයකු සහ හුලංදාව හෝටලයේ කළමනාකරුවාද අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි. ඒ මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශයේ ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි කේශලා බෝගහවත්ත ඇතුළු කණ්ඩායම ඉකුත් 13 වැනිදා අදාළ යුවතිය සිදු කරන ලද පැමිණිල්ලකට අනුව කරන ලද විමර්ශනයෙන් අනතුරුවය.

මේ අපරාධය සිදු කළ පුද්ගලයන් දින පහකදී අත්අඩංගුවට ගෙන එම අපරාධයේ සුලමුල මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශ නිලධාරින් විසින් අනාවරණය කරගත් ආකාරය පෙළ ගැසෙන්නේ මෙලෙසිනි.

21 හැවිරිදි මේ යුවතිය සිය බාප්පා සමඟ ඉකුත් 13 වැනිදා දෙනියායේ සිට මාතරට පැමිණෙන්නේ මාතර පොලිස් අධිකාරි කාර්යාලයේ ස්ථාපිත මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත හමු වී පැමිණිල්ලක් කිරීමටය. ඔවුන් තමන්ට සිදු වූ අපරාධයට සාධාරණයක් බලාපොරොත්තුවෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂිකාව හමුවට පැමිණියේ ඇය මෙවැනි විමර්ශන සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ නමක් දිනාගෙන සිටින දක්ෂ නිලධාරිනියක්ද වන හෙයිනි.

"මැඩම්... මට මේ අපරාධය වුණේ හරියටම ගිය අවුරුද්දේ පෙබරවාරි 07 වැනිදා රෑ... පිටබැද්දර හෝටලයකදී... එදා මට හෝටලයේ කාමරයකදී දොස්තර කෙනෙක් ඉන්ජෙක්ෂන් එකක් විද්දා... ඒ දොස්තර එක්කගෙන ආවේ මගේ පෙම්වතා... පහුවදා පාන්දර 4.45 වෙද්දී මාස පහක් වුණ මගේ බඩේ හිටිය පැටියා එළියට අරගත්තා... එදා දරුවගේ පෙකණිවැල කැපුවේ මගේ බඩට ඒ දරුවා දුන්න මගේ පෙම්වතා... පස්සෙ එයා ඒ බිලිඳු කලලේ ෂොපින් බෑග් එකක දාගෙන අරන් ගියා... ටික දවසකට පස්සෙ තමයි මං දැනගත්තේ ඒ කළලය මගේ පෙම්වතා එයාගේ නීත්‍යනුකූල නෝනා එක්ක පදිංචි වෙලා ඉන්න මාවරලේ ගෙදර මිදුලේ වළ දාලා කියලා... ඒක අදටත් එතැනම තියෙනවා කියලයි ආරංචිය... මැඩම්... මට කළ මේ අපරාධයට සාධාරණයක් කරන්න..."

ලැබුණු එම පැමිණිල්ල පිළිබඳව මාතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිශාන්ත සොයිසා දැනුම්වත් කිරීමත් සමඟ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ උපදෙස් මත ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත ඇතුළු කණ්ඩායම ක්ෂණිකව ක්‍රියාත්මක වූයේ එම යුවතියගේ බිලිඳු කලලය විනාශ කිරීමේ ප්‍රධාන සැකකරු වන ඇගේ පෙම්වතා සොයා ගැනීමටය. ඒ අනුව එම යුවතිය කී තොරතුරු ඔස්සේ ක්‍රියාත්මක වූ ළමා සහ කාන්තා කාර්යාංශ නිලධාරි කණ්ඩායම යුවතියගේ අනියම් සැමියා වන 38 හැවිරිදි සෙනරත් චමින්ද යාපා අත්අඩංගුවට ගත්තේ මාකඳුරේ තේ කර්මාන්ත ශාලාවක රියැදුරු රැකියාවේ නිරත වෙමින් සිටියදීය. ඒ අදාළ යුවතිය පැමිණිල්ල කළ 13 වැනිදා දින රාත්‍රියේමය.


## දින 5කදී සැකකරුවන් තිදෙනාම අත්අඩංගුවට

## දෙවැනි වතාවේ ගැබ් ගත් යුවතිය ගබ්සා කර කලලය නිවෙසේ වළලලා



අත්අඩංගුවට ගත් ව්‍යාජ වෛද්‍යවරයා

"ඇත්ත කියනවා... අපි සේරම දැනගෙනයි ආවේ... තමුන් මේ කලලය වළ දැම්මේ කොහේද...?" පොලිස් නිලධාරින් චමින්දගෙන් ප්‍රශ්න කෙළේ එලෙසය. එහෙත් ඔහු මුලදී පොලිස් ප්‍රශ්න කිරීම් හමුවේ පිළිතුරු දෙන්නට අදිමදි කළේය. අනතුරුව තමාට පොලිසියෙන් ගැලවීමක් නොමැති වග තේරුම් යෑමත් සමඟ ඔහු එදා සිදු කළ එම අපරාධය පිළිගත් ඔහු කලලය වළ දැමූ ස්ථානය ගැන පාපෝච්චාරණය කළේ පොලිස් නිලධාරින් විස්මයෙන් බලා සිටියදීය.



සැකකරුවෙක් අත්අඩංගුවට ගත් අවස්ථාව

දරුවන් තිදෙනකුගේ පියකු වන චමින්ද බිරිය සහ දරුවන් සමඟ පදිංචිව සිටින මාවරලේ, ගොමිල, ඇහැලකන්දවත්තේ නිවෙස ඉදිරිපිට මිදුලේ ස්ථානයක කලලය වළ දමා ඇති බව පොලිසියට කීවේ පොලිසියෙන් ඔහුට බේරීල්ලක් නොමැති වග දැනගෙනය.

කලලය වළ දැමූ ස්ථානය අනාවරණය කරගැනීමත් සමඟ විමර්ශන නිලධරයෝ 13 වැනිදා මධ්‍යම රාත්‍රියේම එම ස්ථානයට පැමිණියෝය. අනතුරුව ඒ පිළිබඳව අදාළ පොලිසිය වන මාවරල පොලිසිය සහ දෙයියන්දර මහේස්ත්‍රාත් අධිකරණය දැනුම්වත් කරන්නට මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශ විමර්ශන නිලධරයෝ කටයුතු කළහ. ඒ අනුව එම කලලය ගොඩගන්නා තෙක් එම ස්ථානයට මාවරල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත හේරත් විසින් සිය නිලධාරින් යොදවා පොලිස් ආරක්ෂාව යෙදවීමට කටයුතු යොදා තිබිණි. පසුව චමින්දගෙන් සිදු කළ ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ඔහු තම ළාබාල පෙම්වතියට එම අපරාධය සිදු කළේ පිටබැද්දර, හුලංදාව හෝටලයක් ඇතුළතදී රුපියල් පනස්දහසක් ගෙවා වෛද්‍යවරයෙක්ද හෝටලයට ගෙන්වා ගැනීමෙන් අනතුරු බවටද හෙළි කළේය.





කලලය වළ දැමූ ස්ථානයේ කැණීම් සිදු කරමින්

ඊට අමතරව බිලිඳා පෙකණිවැලෙන් වෙන් කළේ තමාම බවටද කීවේය. අත්අඩංගුවට පත් චමින්ද අධිකරණයට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

චමින්දගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම් හමුවේ මෙන්ම යුවතිය හෙළි කළ තොරතුරු ඔස්සේ මෙකී අපරාධයේ සුලමුල අනාවරණය වන්නේ මෙලෙසිනි.

මීට වසර පහ, හයකට පමණ පෙරදී චමින්ද ත්‍රිරෝද රථ රියැදුරකු ලෙස සේවය කළේය. ඒ දෙණියායේ අදාළ යුවතියගේ ගම් ප්‍රදේශයේය. යුවතියද ත්‍රිරෝද රථයේ පාසල් ගියා. ඇගේ මවුපියෝද ආබාධිත. ඇය වයස අවුරුදු 15ක දැරිය සමයේ ත්‍රිරෝද රථයේ රියැදුරු චමින්ද සමඟ ප්‍රේම සබඳතාවක් ඇතිකර ගත්තාය. එය දුරදිග ගියේ දෙදෙනාටම නොදැනීය. ඉන් සිදු වූයේ චමින්ද අතින් දැරිය දූෂණය වීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස දැරිය ඇයට වයස අවුරුදු 16දී දරුවකු බිහි කළාය. එලෙස බාල වයස්කාර දැරියක දූෂණය කරමින් දරුවකු බිහි කිරීම නිසා 2019 වසරේ මොරවක මහේස්ත්‍රාත් අධිකරණය මඟින් චමින්දට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරමින් ඔහු බන්ධනාගාරගත කෙරිණි. අනතුරුව ඔහුට එරෙහිව මහාධිකරණයේ නඩු පැවරිණි. නඩුව පවතිද්දී චමින්ද ඇප මත බන්ධනාගාරයෙන් මුදා හැරීමෙන් පසු නිවෙසට පැමිණියේය. දැරිය බිහි කළ බිලිඳා ගාල්ලේ ළමා නිවාසයකට භාර කරන්නට අධිකරණය නියෝග කරද්දී දැරිය දෙණියායේ සිටින ඇගේ ආච්චි අම්මාගේ භාරයට පත් කළේ මවුපියන්ද ආබාධිත තත්ත්වයේ පසු වූ බැවිනි.

කලක් ගත විය. බන්ධනාගාරයෙන් මුදා හැරීමෙන් පසු නිවෙසට පැමිණි චමින්ද නැවත දැරිය සොයා පැමිණියේය. අනතුරුව ඔහු පැවැති අධිකරණ ක්‍රියාවලියෙන්ද බේරීමේ කූට උපායක් ලෙස වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු දැරිය විවාහ කරගන්නා බවට පොරොන්දුවක් දී දෙණියායේ ආච්චිගේ භාරයෙන් ඇයව රැගෙන ගොස් තිබුණේය. එසේ දැරිය රැගෙන ආ චමින්ද ඇය දෙයියන්දර නිවෙසක නතර කළේය.

"අනේ මැඩම් මං ඒ ගෙදර ඉද්දි ෆෝන් එකකින් කෝල් එකක්වත් ගන්න දන්නේ නෑ... චමින්ද මාව කසාද බඳිනවයි කියලා කිවුවා... අවුරුදු 18 සම්පූර්ණ වුණාට පස්සේ... ඒක නිසා මං එයාව විශ්වාස කරගෙන ඒ ගෙදරම හිටියා..." යුවතිය පොලිස් නිලධාරින් ඉදිරියේ අතීතය ආවර්ජනය කළේ එසේය.

චමින්ද එම නිවෙසේ දැරිය නතරකොට දොර වසා යන්නෙ 'යාබද නිවැසියන්ට' 'මම කසාද බැඳපු කෙනාට වැඩිය මුකුත් තේරෙන්නෙ නෑ... චුට්ටක් බලාගන්න...' යැයි ඔවුනට බොරුවක් කියමිනි. ඇය එලෙස දිවි ගෙවා තිබුණේ කුඩා කාමරයක් වැනි නිවෙසක 'සිර අඩස්සියක' වැනි දිවියක් ගත කරමිනි. එම කාමරයේ දැරිය වසර දෙකයි මාස හතක කාලයක් ගත කළාය. ඇය එම නිවෙසේ කාලය ගත කරද්දී චමින්ද අතින් ඇය නැවත ගැබ් ගත්තේය. ඒ 2021 වසරේදීය. ඇය ගැබිනියක් වුවත් ඒ බව අවට වැසියන්ගෙන්ද වසන්කොට කිසිම සායනයකට නොයවා තබා ගැනීමට චමින්ද සූක්ෂ්ම විය. ඒ වන විට චමින්ද විවාහක තිදරු පියෙක් බවද ඇය දැන සිට නැත.

යුවතිය පස් මස් ගැබිනියක් වෙද්දී චමින්ද වහසි බස් කියා කෙසේ හෝ ඇගේ සිය පස් මස් බිලිඳු කලලය විනාශ කරවා ගැනීමට කැමැති කරවාගෙන තිබුණේ ඇයට තර්ජන-ගර්ජනද කරමිනි. ඒ අනුව බිලිඳු කලලය විනාශ කිරීමට චමින්ද සොයාගෙන තිබුණේ මොරවක ප්‍රදේශයේ වයෝවෘද්ධ වෙද මහතෙකි. එම වෙද මහතා මාර්ගයෙන් වෛද්‍යවරයෙක් යැයි කී පුද්ගලයෙක් සොයා ගැනිණි. එම වෛද්‍යවරයා ඇමැතීමත් සමඟ ඔහු ඒ සඳහා රුපියල් පනස්දහසක් අවැසි බවත් ඊට ස්ථානයක්ද නම් කරන ලදි. ඒ පිටබැද්දර, හුලංදාව ප්‍රදේශයේ හෝටලයකි. දෙයියන්දර කාමරයේ සිටි ඇය ත්‍රිරෝද රථයක නංවාගෙන එම හෝටලයට චමින්ද විසින් රැගෙන ගොස් තිබුණේ මිතුරෙක් මාර්ගයෙන් වෛද්‍යවරයෙක් ඒ සඳහා සොයා ගත් බව කියමිනි. එසේ ඇය රැගෙන ගියේ 2022 වසරේ පෙබරවාරි මස 07 වැනිදා සවස් යාමයේය.

එදින රාත්‍රියේ හෝටලයේ කාමරයක් තුළදී අදාළ වෛද්‍යවරයා ඇයට එන්නතක් දී ඇත. ඒ සමඟ පසුදා එනම් අට වැනිදා අලුයම 4.45ට පමණ ඇය පස් මස් බිලිඳු කලලය මෙලොවට බිහි කළාය. ඒ සඳහා එම වෛද්‍යවරයා යැයි කී පුද්ගලයා ඇගේ ගර්භාෂය තුළට කිසියම් කූරක් යවා තමනට වධ දුන් බවද ඇය පොලිසියට හෙළි කළාය. ඇය පොලිසියට කියා තිබුණේ එසේ මෙලොවට බිහි කළ බිලිඳා ඒ වන විටද පණපිටින් සිටි බවයි. එහෙත් චමින්දගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම් හමුවේ ඔහු කියා ඇත්තේ එම බිලිඳාට පණ නොතිබූ බවයි. අනතුරුව එම බිලිඳු කලලය කළු



ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ



නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත සොයිසා



ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත



වැටලීම සිදු කළ නිලධාරීන් කණ්ඩායම

## පුංචි අම්මයි මාමයි ඇවිත් යුවතිය බේරාගෙන

## මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශය සියලු තොරතුරු හෙළිකර ගනී

පැහැති බෑගයක දමාගත් චමින්ද එය රැගෙන ගොස් වළ දමා ඇත්තේ ඔහු ඒ වන විට විවාහක බිරිය සහ දරුවන් තිදෙනා සමඟ පදිංචිව සිටි මාවරලේ නිවෙසේ මිදුලේ ස්ථානයකය. චමින්ද එම බිලිඳු කලලය එම නිවෙසේ වළ දමන සමයේදී ඔහුගේ බිරිය සහ දරුවන් එම නිවෙසෙන් ගොස් සිටියේ චමින්ද සමඟ පැවැති කිසියම් ආරවුලක් නිසාය.

එලෙස බිලඳු කලලය විනාශ කළ චමින්ද නැවත පෙම්වතිය රැගෙන ගොස් නතර කළේ දෙයියන්දර අදාළ නිවෙසේ කාමරයේය. එහි කල්ගත කරන අතරේ ඇය නිතර චමින්දට බල කළේ තමන් විවාහ කරගන්නා ලෙසටය. එහෙත් කල්ගත වෙද්දී ඇයට දැනගන්නට ලැබෙන්නේ චමින්ද දරුවන්ද සිටින විවාහක සේම තමාට වඩා බොහෝ සේ වයස්ගත අයකු බවයි. ඒ සමගම ඇය චමින්ද මෙන්ම ඔහුගේ නීත්‍යනුකූල බිරිය සමඟද ආරවුල් ඇතිකර ගත්තාය. පසුව එම ආරවුල් දිග්ගැස්සෙද්දී හරිහැටි මඟතොටද නොදන්නා ඇය දෙණියායේ සිටින තම පුංචි අම්මා දැනුම්වත් කරන්නේ තමාට අත්වී තිබෙන ශෝචනීය ඉරණම ගැන පවසා හඬා වැටෙමිනි.

"අනේ පුංචි... ආයෙත් මේ මිනිහා මාව අමාරුවේ දැම්මානේ... ඒකා බැඳපු එකෙක්. මම දැන් දෙයියන්දර තැනක හිර කරගෙන තියාගෙන ඉන්නේ... අනේ කොහොමහරි ඇවිත් මාව මේ අපායෙන් අරන් යන්න..." ඇය පුංචි අම්මාට එසේ කීවේ හඬා වැලපෙමිනි.

කලලය විනාශ කිරීමෙන් පසුවද වසරකට ආසන්න කාලයක් එම නිවෙසේ වධ හිංසාවලට ලක් වෙමින් බලෙන් මෙන් රඳවා සිටි ඇය පසුගිය දිනෙක පුංචි අම්මා සහ බාප්පා පැමිණ නැවත දෙණියායට කැඳවාගෙන යන ලදි. අනතුරුව ඒ පිළිබඳව අදාළ පොලිස් ස්ථානවලට පැමිණිලි කිරීමට ගියද පසුව පිරිස තීන්දු කළේ සාධාරණ විමර්ශනයක් සඳහා මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශයට පැමිණීමටය. ඒ අනුව ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත ඇතුළු කණ්ඩායම සිදු කළ පුළුල් විමර්ශනයෙන් මේ යුවතියට මෙන්ම ඇගේ පස් මස් බිලිඳු කලලයට සිදු කළ අපරාධයේ ඛේදනීය කතාව කරළියට පැමිණියේය.

පසුගිය 13 වැනිදා මධ්‍යම රාත්‍රියේම කලලය වළ දැමූ ස්ථානය සොයා ගැනීමත් සමඟ එම නිවෙසේ වෙසෙන චමින්දගේ විවාහක බිරිය ඇතුළු පිරිස පොලිසියට පැවැසුවේ ස්ථානයේ පසුගිය දිනෙක චමින්ද විසින් කැණීමක් සිදු කර එන්නත් කටු වැනි යම් යම් දේ ඉවත්කර ගත් බවය. එසේම චමින්ද එදින තම දරුවකු එම ස්ථානයේ වළ දමා ඇතැයි උපහාසයෙන් මෙන් පැවැසූ බවත් එම නිවැසියෝ හෙළි කළහ.

විමර්ශනයේදී හෙළි වූයේ මේ යුවතිය රඳවා සිටි නිවෙසෙන් පලා ගිය පසු ඇය සියල්ල පොලිසියට හෙළි කරතැයි බියෙන් චමින්ද එම කැණීම සිදුකොට එම ස්ථානයේ තිබූ දෑ ඉවත්කරගන්නට ඇති බවටයි. ඉකුත් 13 වැනිදා චමින්ද අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත්කොට රක්ෂිත බන්ධනාගාරගත කිරීමෙන් පසු විමර්ශන නිලධාරින් උත්සුක වූයේ මේ යුවතියට එම අපරාධය සිදු කළ හෝටලය සොයා ගැනීමටය. ඒ වන විට යුවතියට අදාළ හෝටලයේ හැඩරුව සහ වර්ණ මතකයේ තිබුණද එය කුමන ස්ථානයක පිහිටා තිබේද යන්න නිශ්චිත දැනීමක් නොවූවාය. චමින්දගෙන් ප්‍රශ්න කළද ඔහුද එම ස්ථානය හරිහැටි හෙළිකරන්නට දැන සිටියේ නැත.

පසුව යුවතියද රැගෙන දින ගණනාවක් විමර්ශන කණ්ඩායම් දෙණියාය, මොරවක, පිටබැද්දර, දෙයියන්දර, මාවරල ආදි ප්‍රදේශවල සැරිසරන්නට වූයේ ඇයට මතකයේ තිබෙන එම ස්ථානය සොයා ගැනීමටයි.

ඒ අනුව මේ යුවතිය හෙළි කළ කරුණු අනුව එම ප්‍රදේශවල හෝටල් කිහිපයක් පරීක්ෂා කරද්දී අදාළ හෝටලය සොයා ගැනීමට පොලිස් කණ්ඩායමට හැකි විය. එය පිටබැද්දර, හුලංදාව ප්‍රදේශයේ පිහිටි හෝටලයකි. එම හෝටලයේ අදාළ කාමරයේ වර්ණද යුවතියට මතකයේ තිබිණි. ඇයට එම අපරාධය කිරීම සඳහා යොදා ගත් කාමරය ඇය විමර්ශන කණ්ඩායමට පෙන්වූවාය. එම කාමරය හෝටලයේ කළමනාකරුගේ කාමරයට ආසන්නයේම පිහිටි එකකි. ඒ අනුව යුවතියට අපරාධය සිදු කර තිබුණේ හෝටලයේ කළමනාකරුගේද අනුදැනුම මත හෙයින් 30 හැවිරිදි හෝටල් කළමනාකරුද අත්අඩංගුවට ගැනිණි. ඔහු පොලිසියට කීවේ, එදින සේවාදායකයන්ට තමන් ලබා දුන්නේ එක් කාමරයක් බවයි. එය සනාථ කිරීමට ඔහු හෝටලයට එන යන අයගේ විස්තර සටහන් කරගන්නා පොතද පොලිසියට පෙන්වීය. එහි සඳහන් වූයේ එදින එක් කාමරයක් පමණක් අමුත්තන්ට දී ඇති බවයි. එහෙත් ඔහුගේ දින පොතක සටහන් කර තිබුණේ හෝටලයේ තිබෙන කාමර සියල්ලම එදින සේවාදායකයන්ට ලබා දී ඇති බවය. එසේම යුවතියට එම අපරාධය සිදු කළ කාමරයේ දී තිබුණේ ඉතා වැඩි මිලකට බවත් එහි සඳහන් වී තිබිණි. ඉන් මනාව හෙළි වූයේ කළමනාකරුගේද අනුදැනුම මත එම කාමරය අපරාධයකට උපයෝගී කර ගැනීම සඳහා දී ඇති බවය. හෝටල් හිමිකරුගෙන්ද ප්‍රශ්න කරද්දී ඔහු මේ පිළිබඳ කිසිවක් නොදන්නා බව පොලිසියට කීවේය.

අනතුරුව හෝටල් කළමනාකරුද අත්අඩංගුවට ගැනීමෙන් නොනැවතුණු විමර්ශන කණ්ඩායම මේ යුවතියට මෙම අපරාධය සිදු කළ වෛද්‍යවරයා සොයා ගැනීමට 'දැලක්' එළීය. එහිදී හෙළි වූයේ වෛද්‍යවරයා එම අපරාධයට සම්බන්ධ කර තිබුණේ ආයුර්වේද වෙදැදුරෙක් බවයි. ඔහු සිටින තැන නිශ්චිත ලෙස යුවතියට මතකයේ නොතිබිණි. කෙසේ හෝ එම 'වෙදැදුරා' මොරවක ප්‍රදේශයේ බව ඇය පොලිසියට කීවේය. ඒ අනුව පොලිස් නිලධාරින් ඇය මොරවක



ප්‍රදේශයේ වෙද මහත්වරුන් තිදෙනෙක් ළඟට රැගෙන ගියේ උපක්‍රමයක්ද යොදමිනි.

ඒ අනුව එක් වෙද මහතෙක් ළඟට උපාය දූතයෙක් සමඟ ඇය යවන ලද්දේ වෙදැදුරා හා කතාබහ කරන සහ කියන දේ හොර රහසේ ජංගම දුරකතනයෙන් පටිගත කිරීමටද සලස්වමිනි. එම වෙද මහතා ළඟට ගිය යුවතිය ඔහු සමඟ කතා කළාය.

"අනේ වෙද මහත්තයා... මට ළමයි නැති නිසා පහුගිය දවසක වෙද මහත්තයා ළඟට ආවා මගේ මහත්තයා එක්ක... වෙද මහත්තයා මට හොඳ දොස්තර කෙනෙක් හොයලා දුන්නා... ඒ දොස්තර මහත්තයා බෙහෙත් කළා ඒත් හරි ගියේ නෑනේ..." යැයි ඇය කීවේ පොලිසියේ උපදෙස් පරිදිය.

ඒ සමඟ කල්පනාවට වැටුණු වයෝවෘද්ධ වෙද මහත්මයාට සිද්ධිය සිහිපත් විය.

"ආ... ඉන්නකෝ මට ඔය සිද්ධිය මතක් වුණා... ඉන්නකෝ ළමයා... මං ඒ දොස්තර මහත්තයගේ අංකේ හොයලා දෙන්නම්... කතා කරලා වැඩේ කරගන්න..."

ඒ අනුව එම වෙද මහතා මාර්ගයෙන් යුවතියගේ කලලය විනාශ කිරීමට චමින්ද විසින් රුපියල් පනස්දහසක මුදලකට සොයා ගන්නා ලද වෛද්‍යවරයෙක් යැයි කී පුද්ගලයාගේ දුරකතන අංකය සොයා ගැනීමට පොලිසියට හැකි විය. අනතුරුව උපාය දූතයා ඔස්සේ එම 'දොස්තර' සම්බන්ධ කරගැනීමට යුවතියට හැකි විය. ඔහුට සියල්ල පැවැසීමත් සමඟ ඊට වෛද්‍යවරයා ලෙස පෙනී සිටි තැනැත්තා රුපියල් 45000ක මුදලක් ඉල්ලීය. එම මුදලට කැමැත්ත ප්‍රකාශ කිරීමත් සමඟ ඔහු කිසියම් ස්ථානයක් කීවේය. ඒ එදා යුවතියගේ කලලය විනාශ කළ පිටබැද්දර, හුලංදාවේ හෝටලයමය. ඒ අනුව ඉකුත් සිකුරාදා දිනෙක සවස එම ස්ථානයට වෛද්‍යවරයා පැමිණෙන බව කීවේය. ඊට පෙර ඔහුට යම් මුදල් ප්‍රමාණයක්ද ගිණුම්ගත කරන ලෙස පැවැසීය. ඒ සියල්ලෙන් පසුව මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශ නිලධාරින් අකුරැස්ස පොලිසියේ නිලධාරීහු දෙදෙනෙක්ද සමඟ ඒ වන විට අනාවරණය කරගෙන තිබූ එම හෝටලයේ රැකවල්ලා සිටියහ. වෛද්‍යවරයා යැයි කී පුද්ගලයා ඔහු කී වේලාවට පැමිණීමත් සමඟ අත්අඩංගුවට ගත්තේ උපක්‍රම රැසක් යොදමිනි. ඔහු එදින හෝටලයට පැමිණියේ යතුරුපැදියකිනි. එම යතුරුපැදිය සමඟ 'පොලිස් ගැටයට' හසුවූ සැකකරු වෛද්‍යවරයෙක් ලෙස පෙනී සිටි ව්‍යාජ වෛද්‍යවරයෙකි.

සැකකරු 57 හැවිරිදි අයෙකි. හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වන ඔහු ගුවන් හමුදාවේ හෙද නිලධාරියෙක් ලෙස කටයුතු කොට ඉන් ඉවත් වූ අයෙකි. සැකකාර ව්‍යාජ වෛද්‍යවරයාද සමඟ යුවතියට සිදු කළ අපරාධය සම්බන්ධයෙන් හෝටල් කළමනාකරු සහ ප්‍රධාන සැකකරු වන චමින්දද අත්අඩංගුවට ගෙන මොරවක මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාරගත කෙරුණේ මාතර කොට්ඨාස ළමා සහ කාන්තා කාර්යාංශ නිලධාරින් දින කීපයක් තුළ දිවා රෑ නොබලා සිදු කළ පුළුල් විමර්ශනයකින් පසුවය.

දකුණු පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ, මාතර - තංගල්ල දිසා භාර නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්නගේ උපදෙස් මත මාතර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිශාන්ත සොයිසාගේ මෙහෙයවීමෙන් මාතර කොට්ඨාස ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි කේශලා බෝගහවත්ත, උපපොලිස් පරීක්ෂක අතුල, කොස්තාපල් 71437 සම්පත්, කොස්තාපල්වරියන් වන 7533 මධුෂිකා, 11138 සෙව්වන්දි, කොස්තාපල් රියැදුරු 80473 වසන්ත අකුරැස්ස පොලිස් ස්ථානයේ සැරයන් 47941 හේමන්ත සහ කොස්තාපල් 68274 සිරිබද්දන යන නිලධාරීහු විමර්ශනවලට එක් වූහ.



## පෙම්වතා නිසා මවක වූ දැරිය දෙවැනි වරටත් ඔහුට රැවටිලා

## සැකකරුට දාව බිහි කළ පළමු දරුවා ළමා නිවාසයක

## අවුරුදු දෙකක් දෙයියන්දර ගෙදරක යුවතිය සිර කරලා

## 21 හැවිරිදි යුවතිය 15 වැනි වියේ සිටම ත්‍රිරෝද රියැදුරු අතින් අපයෝජනය වෙලා



# තිදෙනෙක් එකතු වී වස පෙව්වා කියා කීවත්

# සිරිපාල මියගියේ වස බීලා

## වස පොවා සිදු කළ මිනිස් ඝාතනයක් නොවන බව හෙළි කළ අධිකරණ වෛද්‍ය පරීක්ෂණය

■ ලලිත් චාමින්ද

**ශ්‍රී ට වසර දාහතරකට පහළොවකට පමණ ඉහතදී කෘමිනාශක ශරීරගත වී අසාධ්‍ය තත්ත්වයෙන් පසුවූ තිදරු පියෙකු කරාපිටිය ශික්ෂණ රෝහලට ඇතුළත් කෙරිණි. කිසියම් පිරිසක් තමන්ට බලහත්කාරයෙන් වස පෙවූ බවට ඔහු වාට්ටු භාර වෛද්‍යවරයාට කීවේය. කිසියම් අයෙකුට බලහත්කාරයෙන් වස පොවා ඇතිනම් ලංකාවේ නීතිය අනුව එය මිනීමරුමකට තැත් කිරීමකි. මෙකී රෝගියාගේ සායනික පරීක්ෂණ කටයුතු සඳහා විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි යූ.සී. පී. පෙරේර රෝගියා සිටි වාට්ටුවට ගියේය. ඒ වනවිටත් මෙම රෝගියා අසාධ්‍ය තත්ත්වයෙන් පසු විය.**

"දොස්තර මහත්තයෝ 'සෝමේ, චුට්ටේ, පොඩ්ඩා එකතුවෙලා මට බලහත්කාරයෙන් වස පෙව්වා" යැයි රෝගියා ඉතා අපහසුවෙන් කීවේය.'

විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි රෝගියාගේ මෙම ප්‍රකාශය සටහන් කරගෙන ඊට ඔහුගේ අත්සනද ලබා ගත්තේය. අධිකරණ වෛද්‍යවරයා රෝගියාගේ සායනික පරීක්ෂණ පැවැත්වූ දිනට පසු දින ඔහු මිය ගියේය. ඔහුගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වුයේ ද විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි යූ.සී.පී. පෙරේරාය.

අපරාධ නීතියේ සාක්ෂි පනතේ 32-1 වගන්තිය යටතේ මරණාසන්න අවස්ථාවකදී යම්කිසි පුද්ගලයකු විසින් ලබාදෙන ප්‍රකාශය ඉතා වැදගත් වන්නේය. මෙම රෝගියා විසින් මරණාසන්න අවස්ථාවේ ලබාදුන් ප්‍රකාශයත් සමඟ ඔහුගේ මරණය මිනීමැරුමක් බවට තීරණය විය. ඔහුට වස පෙවූ බව කියන පුද්ගලයින් සිවුදෙනා පොලිස් අත්අඩංගුවට ගැනිණි. පොලිසිය සැකකරුවන්ගෙන් ප්‍රශ්න කරන ලදී.

"අනේ සර් මේ මොන අපරාධයක්ද? අපි මේ මනුස්සයාට වස පෙව්වේ නැහැ. මේක බොරුවක්." පොලිස් ස්ථානාධිපති ඉදිරියේ සැකකරුවෝ එසේ ප්‍රකාශ කළහ. පොලිසිය ඔවුන් සිවුදෙනාට මිනීමැරීමේ චෝදනා යටතේ නඩු පවරනු ලැබීය. යම්කිසි පුද්ගලයකුට වස නාසයෙන් මුඛයෙන් සහ සමෙන් ශරීරගත විය හැක. එන්නත් කිරීමෙන් ද වස ශරීරගත කළ හැකිය.

මියගිය පුද්ගලයාගේ පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි තීරණය කළේ කෘමිනාශක ශරීරගත වීම නිසා මොහු මියගොස් ඇති බවය. එය හෙළි වුයේ පශ්චාත් මරණ පරීක්ෂණයේදීය.

මෙකී පුද්ගලයා මියගියේ තමන් විසින්ම කෘමිනාශක පානයකොට සිය දිවි හානිකර ගැනීමකින්ද? නොඑසේනම් කිසියම් පිරිසක් විසින් ඔහුට බලහත්කාරයෙන් කෘමිනාශක පෙව්වාද? මෙය අනාවරණය කර ගැනීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා විසින් පරීක්ෂණ ආරම්භ කරනු ලැබීය. මක් නිසාදයත් කෙනෙකුට වස පෙවීම එතරම් පහසු කාරියක් නොවන බැවිනි.

එහෙත් මියගිය පුද්ගලයා මිය යාමට ආසන්න අවස්ථාවේ දී තමන්ට පිරිසක් විසින් වස

## වස පෙවූ අයකුගේ සිරුරේ ලක්ෂණ සිරිපාලගේ තිබුණේ නෑ



ගාල්ල කරාපිටිය වෛද්‍ය පීඨයේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි මහාචාර්ය යූ.සී. පී. පෙරේරා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරෙනි.

පෙවූ බවට කළ ප්‍රකාශය නිසා මෙය මහත් ආන්දොලනාත්මක සිද්ධියක් විය. ජීවත්ව සිටින අයෙකු කෘමිනාශක පානය කළ විට ආමාශයේ ඇතුළු පැත්ත රත් පැහැවි ලේ ලප හට ගනී. මිය යාමෙන් පසුව කිසියම් අයෙකුට වස පෙව්වේ නම් ආමාශය තුළ වස තිබිය හැකි වුවත් ග්‍රහණිය දක්වා වස ව්‍යාප්ත වන්නේ නැත. එමෙන්ම ආමාශයේ ඇතුළත ලේ ලප ඇති නොවේ. කෘමිනාශක ශරීරගත වු විට උදරය මොලොක් වී වලිප්පුව හටගෙන පෙණහැලිවල වතුර එකතුවේ. තව ද ආමාශය සහ ගලනාලය පිලිස්සීමට ලක්වේ. අධි සාන්ද්‍රණික කෘමිනාශකයන් පානය කිරීමෙන් ආමාශය තැම්බිම, පිලිස්සීම නිසා අමාශය සිදුරු වීම ද සිදු විය හැක.

කෘමිනාශක විශාල ප්‍රමාණයක් පානය කළේ නම් පැය කිහිපයක් ඇතුළත එම පුද්ගලයා මිය යයි. එහෙත් මෙම තිදරු පියා වස ශරීරගත විමෙන් පසු දින හතක් පමණ රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියේය. මේ තුළින් පැහැදිලි වන්නේ මොහුට ඉතා සුළු ප්‍රමාණයක් වස ශරීරගත වී ඇති බවය. යම් කිසි අයකු දිවි හානි කර ගැනීම සඳහා වස පානය කළේ නම් විශාල ප්‍රමාණයක් වස පානය කිරීම සාමාන්‍ය සිරිතයි. එහෙත් මියගිය පුද්ගලයාගේ වස ශරිරගතව තිබුණේ ඉතා සුළු ප්‍රමාණයකි. කිසියම් පිරිසක් විසින් වස පෙව්වේ නම් විශාල වස ප්‍රමාණයක් කිසියම් අයෙකුට පෙවිය නොහැකිය. මෙය මොහුගේ වාසියට හේතු වි තිබුණි. එහෙත් පළපුරුදු අධිකරණ වෛද්‍යවරයකුට සත්‍ය වසන් කළ නොහැකිය. ඉක්බිතිව අධිකරණ වෛද්‍යවරයා විසින් මියගිය පුද්ගලයාගේ සිරුරේ බාහිර ලකුණු පරික්ෂා කළේය.

සාමාන්‍යයෙන් කාන්තාවකට වඩා පිරිමි අයෙකුට බලහත්කාරයෙන් වස පෙවීම ඉතා අපහසු කාරියකි. කායික දුබලතාවකින් සහ සිහිමඳ ගතියෙන් පසුවන අයෙකුට බලහත්කාරයෙන් වස පෙවීම එතරම් අපහසු නොවේ.

"කිසියම් පුද්ගලයෙකුට බලහත්කාරයෙන් වස පෙවීමේදී ඔහු දඟලනවා. ඔහුගේ ගෙල අතපය අල්ලාගෙන තමයි වස පොවන්න ඕන. එහෙම අවස්ථාවකදී එම පුද්ගලයාගේ ගෙලෙහි සිරුරේ නියපොතු පහරවල් හෝ සිරීම් තුවාල තිබෙන්න ඕන. වස සිරුරේ හැළෙන්න ඕන. කම්මුලේ ගෙලෙහි හැළෙන්න ඕන. නමුත් මෙකී පුද්ගලයාගේ සිරුරේ එවැනි ලක්ෂණ තිබුණේ නැහැ." විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරි යූ.සී.පී. පෙරේර කීවේය.




## කියතක ආරවුලකට මිතුරන්ගෙන් පලිගන්න කළ බොරුව

කෘමිනාශකවලින් දැඩි දුර්ගන්ධයක් වහනය වන්නේය. එම නිසා වස යම්කිසි අයෙකුගේ නාසයට කිට්ටු කිරීමටත් පෙර ඔහු දඟලනු ලබයි. මේ නිසා කෙනෙකුට වස පෙවීම ඉතා අපහසුය.

"මේ ගැන සාක්ෂි දෙන්න අධිකරණය මාවත් කැඳවුවා. තිදරු පියා මිය ගියේ වස ශරීරගත වීමෙන් බව මා ප්‍රකාශ කළා. එහෙත් මියගිය පුද්ගලයා මරණාසන්නයේ දී කළ ප්‍රකාශය සනාථ කරන්න කරුණු තිබුණේ නැහැ. කිසියම් පිරිසක් බලහත්කාරයෙන් වස පෙවූ බවට සනාථ කිරීමට කරුණු තිබුණේ නැහැ. ඇත්තෙන් ම මෙවැනි පරික්ෂණවලදී සිද්ධිමය කරුණු ඉතා වැදගත් මියගිය පුද්ගලයාගේ සිරුරේ බාහිර ලක්ෂණ පරික්ෂා කිරීමෙන් වස පෙව්වාද? වස බිව්වාද කියා සොයා ගන්න පුළුවන්" යැයි විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා කීවේය.

මෙකී කතාවේ සත්‍ය තත්ත්වය අනාවරණය වන්නේ මේ අයුරිනි.

මියගිය තිදරු පියා අපි 'සිරිපාල' යැයි කියමු. හේ වඩු කාර්මිකයෙකි. සිරිපාලගේ කියතක් ඔහුට වස පෙවූ බව කියන සිවුදෙනාගෙන් අයෙකු විසින් ඉල්ලාගෙන තිබුණි. සති කිහිපයක් ගතවිය. කියත ගෙනවිත් දෙන ලෙස සිරිපාල කීප වතාවක්ම ඔහුට කීවේය. එහෙත් සිරිපාලට කියත ලැබුණේ නැත. මේ නිසා ඔහු දැඩි කෝපයට පත්ව සිටියේය.

"මම හම්බකරගෙන කන ආයුධ කාටවත් දෙන්නේ නැහැ. හිතවත්කමට තමයි කියත දුන්නේ" සිරිපාල මේ අය හමුවී කීවේය.

"කියත දෙන්නේ නැහැ... අපි උල තියන්නද? පුළුවන් දෙයක් කරන්න" මෙහි සිටි අයෙක් සිරිපාලට කීවේය.


මේ කතාවෙන් සිරිපාලට යකා නැග්ගෙය. කියත සම්බන්ධයෙන් දේපාර්ශ්වය අතර ඇතිවු ආරවුල ගැටුමක් බවට පත්වීමට වැඩි වෙලාවක් ගත වූයේ නැත. පිරිසේ සිටි අයෙක් සිරිපාලට පහරවල් කිහිපයක් ගැසුවේය. ආඩම්බරකාරයෙකු වූ සිරිපාල මේ නිසා දැඩි ලැජ්ජාවට පත්විය. සිරිපාලට පහර දුන් පුවත ළැව් ගින්නක් සේ ගම පුරා පැතිරී ගියේය. මේ නිසා සිරිපාල මානසිකව දැඩි පීඩාවකට ලක්ව සිටියේය. හේ වෙළෙඳසැලකට ගොස් කෘමිනාශක බෝතලයක් මිලදී ගත්තේය.

වස බෝතලයෙන් ස්වල්පයක් පානය කළ සිරිපාල නිවසට ගියේය. කොටින්ම කිවහොත් සිරිපාල වස පානය කළේ දිවි හානිකර ගැනීමේ අරමුණින්ම නොවේ.

"සෝමේ චුට්ටේ, පොඩ්ඩේ එකතුවෙලා මට පහර දීලා වස පෙව්වා." සිරිපාල බිරියට කීවේය. සිරිපාල රෝහල් ගතකොට දින හතකට පමණ පසු මිය ගියේය.

විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා විසින් මේ සම්බන්ධව විවෘත අධිකරණයේ දී ලබාදුන් සාක්ෂිය නිසා සිරිපාල කෘමිනාශක පානය කොට දිවි හානිකර ගැනීමෙන් ඔහුගේ මරණය වී ඇති බවට තීන්දු කෙරුණි. සාවද්‍ය නිගමනවලට එළඹීමෙන් නිර්දෝෂි පුද්ගලයින්ට පවා නීතියෙන් දඬුවම් ලැබීමේ අවස්ථා උදාවිය හැකි බව මේ තුළින් පැහැදිලි වන්නේය. ඒ විතරක් නොව අපරාධයක සුලමුල අනාවරණය කරගැනීමේ දී මෙන්ම සැබැවින්ම අපරාධයකට සම්බන්ධ නොවු පුද්ගලයින්ට කිසියම් අපරාධයක් සම්බන්ධව චෝදනා එල්ලවු අවස්ථාවන්වලදී ඔවුන්ගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා අධිකරණ වෛද්‍ය විද්‍යවෙන් ඉටු වන්නේ සුවිශේෂී වූ කාර්යභාරයකි.





සැකකරු සහ සැකකාරිය



සැකකාරිය සන්තකයේ තිබී අත්අඩංගුවට ගැනුණු හෙරොයින් සහ ජංගම දුරකතනය

# හරක් කටා ඩුබායි ඉඳන් මිදිගම ඥාතියාට කළ අපරාධය

■ ප්‍රියදර්ශනී කහවල
ඉංගිරිය මධ්‍යම සමූහ

**වැලිගම, මිදිගම යනු මෙරට සුන්දරම ප්‍රදේශයකි. නමුත් මෑත කාලීනව 'මිදිගම' යැයි පැවසූ පමණින් සියලු දෙනාගේ මනසේ මැවෙන්නේ පාතාලය සහ බිහිසුණු ඝාතනවලින් සමන්විත භයංකාර සිදුවීම් බහුල ප්‍රදේශයකි. පසුගිය කාලයේ එක දිගට සිදුවූ ඝාතන වැලත් සමඟ මිදිගම මෙරට සතර දිග්භාගයේම ප්‍රචලිත වූයේ ඉහත සඳහන් කළ ප්‍රතිරූපය නිසාය. ඊට අත්වැල් සපයමින් මීට දින ගණනාවකට ඉහතදී එනම් පසුගිය 11 වැනිදා පිරිසක් විසින් 24 හැවිරිදි තරුණයකු අමු අමුවේ කපාකොටා මරා දැමුවේ අතිශය අමානුෂීය අයුරිනි.**

මේ ඝාතනය සිදු වී සතියක් ඉක්ම යද්දී ඝාතන සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන්ට හැකි විය. ඒ මහරගමදී සහ මිදිගමදී සිදු කරන ලද වැටලීම්වලිනි.

මෙහි ඇස් අදහාගත නොහැකි කාරණය වන්නේ මියගිය තරුණයාගේ ඝාතනයට අත්අඩංගුවට ගත් දෙදෙනාගෙන් එක් අයෙක් වසර අටක් පුරා ඔහු සමඟ 'දිවට දිව' ගාගෙන සිටි ඔහුගේ ආදරණීය 'අනියම් පෙම්වතිය' වීමයි. ඇය අත්අඩංගුවට ගැනුණේ පසුගිය 18 වැනිදා මහරගම, පමුණුව, උඩහේන පාරේ නිවෙසක සිටියදීය.

මෙලෙස ඝාතනය කෙරුණේ මිදිගම පදිංචිව සිටි මධුර ලක්ෂාන් හෙවත් 'හිච්චි මල්ලී' නම් අවිවාහක තරුණයෙකි. මධුර ලක්ෂාන් ඝාතනය කිරීම සඳහා දුරකතන ඇමතුමක් ඔහුට ගෙන්වාගෙන තිබුණේ මෙලෙස අත්අඩංගුවට ගැනුණු 'අනියම් පෙම්වතිය' විසිනි.

සිහිනෙකින්වත් නොසිතූ අයුරින් තම සෙනෙහෙවන්තියගේ 'දායකත්වයෙන්' නොඑන ගමන් ගිය මධුරගේ කතාව පෙළ ගැසෙනුයේ මෙලෙසය.

'මධුර' හෙවත් 'හිච්චි මල්ලී' අවිවාහක තරුණයකු වුවද ඔහුගේ 'සුරතලිය' මධුරට වඩා වසර කිහිපයකින් වැඩිමල්, එනම් 31 හැවිරිදි වියේ පසුවන ටීනා නමැති විවාහක කාන්තාවකි.

ඇගේ සැමියා වන දිනේෂ් මධුසංඛ හෙවත් බූලා සිදු කරන ලද මිනිස් ඝාතනයක් සම්බන්ධයෙන් මේ වන විට රක්ෂිත

## 'හිච්චි මල්ලී' සන්නද්ධ කල්ලියට කොටු වන්නේ නිවෙසක් ඇතුළේ

බන්ධනාගාරගතව සිටින අතර, සැමියාගේද අඩුව කිසි ලෙසකින්වත් නොදැනෙන ලෙස මත්කුඩු ඇතුළු නීති විරෝධී ව්‍යාපාරයන්වලට සම්බන්ධ වූ ඇය කොල්ලුපිටිය ප්‍රදේශයේ පිහිටි කැසිනෝ හලක 'යාවජීව' සාමාජිකාවකි.

සැමියා බන්ධනාගාරගත වුවද ඇයට කිසිදා තනිනොතනියක් දැනුණේ නැත. ඒ 'හිච්චි මල්ලී' ඇගේ දුකසැප බලමින් නිතරම ඇය අසල රැඳුණු හෙයිනි. ගම් ප්‍රදේශයේ තරුණියන්ට පිහිටන සුකුමාල ළඳබොළඳ ගති තිබූ ඇගේ තනිය මැකුවේ 'හිච්චි මල්ලි' පමණක්ම නොවේ.

දැනට විදේශගතව සිටින මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු සහ සංවිධානාත්මක අපරාධකරුවකු වන හරක් කටා ඇගේ 'අනියම් සැමියාගේ' භූමිකාව රඟ දැක්වීමට එක්ව තිබුණි.

විදේශයන්හි සිට ඔහු මෙහෙයවන මහා පරිමාණ මත්කුඩු ජාවාරම්වලට මෙරට සිට උපරිම සහයෝගය ලබා දුන් ටීනා සියල්ල සමබරව සිදු කරමින් රාත්‍රී සමාජ ශාලාවලටද නිතිපතා ආ ගිය අතර, මිදිගම සිට අධිවේගී මාර්ගය හරහා කොල්ලුපිටියට එලෙස ගමන් බිමන් සිදු කිරීමට බොහෝ විට යොදා ගත්තේ වෑන් රථයකි.

අවුරුදු දෙකක් වයසැති දරුවකුගේ මෙන්ම වයස අවුරුදු 12ක් පමණ වන දියණියකගේ මවක් වුවද ඇය දිනපතා මත්පැන් පානය කරමින් 'කාමභෝගී' ජීවිතයක් ගත කළ අතර, ඇගේ කුඩා දරුවා හැදී වැඩුණේ ද ඇගේ මවට පින්සිදු වන්නටය.

සියල්ල කණපිට හැරෙනුයේ ඇගේ විදෙස්ගත පෙම්වතා වන හරක් කටාගේ බිරියගේ වැඩිමල් සොහොයුරියගේ පුත්‍රයා වන 'හිච්චි මල්ලී' ඇති කරගන්නා ආරවුලක් සමඟිනි.

'හිච්චි මල්ලී' සමඟ තම 'පෙම්වතියගේ' ඇති ගනුදෙනුව සම්බන්ධයෙන්ද මනාව දැනුම්වත් නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම දිනක ගැටලුවක් නොතිබුණු හරක් කටා, තම ඥාති පුත්‍රයාත් සමඟ ඇතිකරගත් ආරවුලේ පළිය 'හිච්චි මල්ලීගේ'



මධුර ලක්ෂාන් හෙවත් හිච්චි මල්ලී

ලෙයින් ගැනීමට ඇම වශයෙන් යොදා ගත්තේ 'හිච්චි මල්ලීගේ' මෙන්ම තමාගේද සෙනෙහෙවන්තිය වූ අත්අඩංගුවට පත් ටීනායි.

"හිච්චි මල්ලිට' කෝල් එකක් දීලා ගෙන්නගන්න. ඒ අතරවාරෙ දිගටම ඌත් එක්ක ෆෝන් එකේම ඉන්න ඕනි. තමුන්ගේ ෆෝන් එකේ ස්පීකරේ ඔන් කරලා තව ෆෝන් එකකින් මට කෝල් එකක් අරන් දෙන්නගෙ කතාව මට ඇහෙන්න කරන්නත් ඕනි...." හරක් කටාගෙන් ඇයට උපදෙස් ලැබුණේ එලෙසිනි.

හරක් කටාගෙන් ලද උපදෙස් අනුවම කටයුතු කළ ඇය 'හිච්චි මල්ලිට' ඇමතුමක් දුන්නේ ඔහුට කිසිම සැකයක් ඇති නොවන අයුරිනි.

**පෙම්වතිය 'ඇමට'දී මිදිගමට ගෙන්වූ මධුර ලක්ෂාන් අවසන් ගමන් යවලා**

## සැකකාරියත් හරක් කටාගේ අනියම් බිරියක්

"අපේ බිස්නස්වල සල්ලි වගයක් බේරන්න තියෙනවා. එන්න පුළුවන්ද මිදිගමට....?" සිය පෙම්වතියගෙන් ලැබුණු මේ ආරාධනාව සම්බන්ධයෙන් අල්ප මාත්‍රයක සැකයක් 'හිච්චි මල්ලීට' තිබුණේ නැත.

මන්ද යත් ඇය තම පණ සමාන සෙනෙහෙවන්තියයි. ඇය කී පරිදිම ඇය හමුවීමට ඒමට පිටත්වූ හිච්චි මල්ලී සමඟ දිගින් දිගටම දුරකතනයේ ඇය රැඳී සිටිමින් ඔහු එලෙස පැමිණෙන ගමන් මාර්ගය සම්බන්ධව සියලු විස්තර තවත් දුරකතනයක් හරහා හරක් කටාට දැනුම් දීමට කටයුතු කළාය.

මිදිගමට පැමිණීමට 'හිච්චි මල්ලී' යොදා ගත්තේ ත්‍රිරෝද රථයකි. කාන්තාව ඒ සඳහා භාවිත කළේ ඇය නිතර ගමන් බිමන් සඳහා යොදා ගත් වෑන් රථයයි.

සිය විදෙස්ගත පෙම්වතා තමා ලවා ගසන ගැටය කුමක්දැයි නොදැන මෙලෙස 'හිච්චි මල්ලී' ගෙන්වා ගැනීමට ඇය කටයුතු කරන ලද්දේයැයි එක් නිමේෂයකට මෙය කියවන ඔබට සිතුණද සත්‍ය වශයෙන්ම එලෙස ඔහු ගෙන්වා ගන්නේ ඝාතනය කර මරා දැමීමට බව ඇය සහසුද්දෙන්ම දැන සිටියාය.

වසර ගණනක් තම තුරුලේ රැඳුණු පෙම්වතා අනෙක් පෙම්වතාගේ අතින් ඝාතනය කරවීමට සහයෝගය දීමට ඇය කෙලෙස හිත එකඟ කරගත්තාදැයි යන්න ගැටලුවක් වුවත්, ඇය ඒ ලෙසින්ම සියල්ල අකුරටම ඉටු කිරීමට තරම් 'ගල් සිතැත්තියක' වූවාය. මිදිගමට පැමිණි 'හිච්චි මල්ලීට' මුදල් ගනුදෙනුව වෙනුවට සිදු වූයේ හය හත්දෙනකුගෙන් යුත් කණ්ඩායමකින් එල්ල වුණු තියුණු ආයුධ ප්‍රහාරයකට ලක් වීමටය. සිදුවන්නට යන දෙය ඉවෙන් මෙන් තේරුම් ගත් ඔහු මරු විකල්ලෙන් අසල නිවෙසකට දුව ගොස් දොර වසා ගත්තද, වියරු මෘග රැළක් මෙන් දොරටුව කඩා දමා එහි ඇතුළුවූ ඝාතකයෝ වන සතෙකු දඩයම් කරනවාටත් වඩා අන්ත කුරිරු ලෙසින් 'හිච්චි මල්ලීගේ' සිරුර කොටස්වලට වෙන් කළහ.



නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දර

සිද්ධිය වූ ස්ථානයේම ඔහු අවසන් හුස්ම හෙළද්දී වෑන් රථයේ නැගුණු කාන්තාව පිටව යන්නේ තම සුපුරුදු රාත්‍රී සමාජ ශාලාව වෙතයි.

එහිදී ඔට්ටු ඇල්లූ මුදල්ද පරාජය වන ඇය ඉන්පසු වැලිවේරිය ප්‍රදේශයේ කාමරයක් කුලියට ගෙන වෑන් රථ රියදුරාද සමඟ දින කිහිපයක් එහි රැඳී සිටින අතර, පසුව කොළඹ ආසන්නයේ කාමරයක තවත් දින දෙකක් රැඳී සිටින්නේ භාවිත කරන දුරකතන සිම්පත්ද වරින්වර මාරු කරමිනි.



නඳුන් චින්තක වික්‍රමරත්න හෙවත් හරක් කටා

අවසානයේ මහරගම පමුණුව මාර්ගයේ නිවෙසක් මසකට රුපියල් 42,000 ක කුලී පදනමකට ඇය විසින් මිලට ගන්නා අතර, ඒ සඳහා අවශ්‍ය බරපැන ලැබෙනුයේ හරක් කටාගෙනි. තමන් නවාතැන් ගත් කාමරයට පසුව තම කුඩා දරුවාද ගෙන්වා ගැනීමට ඇය කටයුතු කරන අතර, වෑන් රථ රියැදුරා එම නිවෙසින් පිටත් කරන්නේ දින කිහිපයකට පසුවය.

මෙම සියලු කරුණු සම්බන්ධයෙන් සිදු කරන ලද මනා අධීක්ෂණයකින් පසු විශේෂ කාර්ය බළකා අණදෙන නිලධාරී, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ වරුණ ජයසුන්දරගේ උපදෙස් මත සහකාර පොලිස් අධිකාරි (බුද්ධි/විශේෂ මෙහෙයුම්/ මත්ද්‍රව්‍ය නාශක සහ සංවිධානාත්මක අපරාධ මර්දන) සාගර කුලසේකරගේ අධීක්ෂණයෙන් සංවිධානාත්මක අපරාධ මර්දන ඒකකය II ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සී. ආර්. පාරමුල්ලගේ මෙහෙයවීමෙන් හෙරොයින් ග්‍රෑම් 12ත් මිලිග්‍රෑම් 800ක් සමඟ ඇය අත්අඩංගුවට පත් වන්නේ එතෙක් මෙතෙක් රඟ දැක්වූ සියලු නාටකයන්ට විරාමය තබමිනි.

ඇගෙන් ප්‍රශ්න කිරීම් හමුවේ ලද තොරතුරුවලට අනුව පසුගිය 20 වැනිදා ඇය ගමන් ගත් වෑන් රථයේ රියැදුරා ලෙස කටයුතු කළ 22 හැවිරිදි තරුණයකුද අත්අඩංගුවට ගැනීමට නිලධාරීන් සමත් විය. ඔහු මිදිගම, පාතේගම, ලෙනාඩ් වත්තේ පදිංචිකරුවෙකි.

සැකකරු සහ සැකකාරිය මාතර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයට භාරදුන් අතර, එතෙක් කිසිම වගකීමකින් තොර මහත් විනෝදකාමී, කාමභෝගී ජීවිතයක් ගතකළ සැකකාර කත සිපිරි ගෙයක බිත්ති සතරකට කොටු වන්නේ වසර ගණනක් පෙම්කළ පෙම්වතා පාවා දී අනෙක් පෙම්වතා ලවා ඔහු ඝාතනය කිරීමට තරම් සිත ගලක් වූයේ කෙලෙසකදැයි යන පැනය ඇය අත්අඩංගුවට ගත් නිලධාරීන්ගේ සිත්වලද ප්‍රශ්නයක් ඉතුරු කරමිනි.

## චූදිතට එරෙහි සාක්ෂි අධිකරණයේ දී ඔප්පු කිරීමට නොහැකි වෙයි



මහාදේවන් සතාසිවම් ශ්‍රීමත් ඩොනල්ඩ් බ්‍රැඩ්මන් සමඟ ක්‍රිකට් පිටියේ දී

# බිරිය ඝාතනයේ වරදට චූදිත සතාසිවම් නිදහස්


## රට කැලඹූ සතාසිවම් නඩුව

**මෙරට ඉතිහාසයේ මතභේදාත්මක තීන්දු තීරණ ලැබූ ආන්දෝලනාත්මක මිනීමැරුම් නඩු කිහිපයක්ම විය. සතාසිවම් නඩුව, එරික් බචෝ නඩුව, පෝලින් ද කෲස් නඩුව, කැලැත්තෑවේ මිනීමැරුම මෙන්ම පත්මිණී කුලරත්න ඝාතනය ද එසේ ආන්දෝලනයට ලක්වූ නඩු තීන්දු අතර වේ. එකල පොලිස් පරීක්ෂණ ක්‍රම මෙකල තරම් දියුණු නොවීම මෙන්ම තාක්ෂණික ක්‍රම මෙතරම් දියුණුව නොතිබීම නිසා සාක්ෂි නිවැරැදිව තහවුරු කරගැනීමේ ක්‍රමවේද නොතිබීම වැනි හේතු නිසා ඒවා නීතිඥයන්ගේ දක්ෂතාව මත ඔවුන්ගේ සේවාදායකයාට වාසි සැලසෙන සේ විසඳී ඇති බව ඒවා අධ්‍යයනයේදී පෙනී යන කරුණුය. ඒ අතරින් සතාසිවම් ඝාතන නඩුව මුල් තැනක් ගනී. ජාත්‍යන්තරයේ ද අවධානයට ලක්වෙමින් ජාත්‍යන්තර නීතියේ සහ නීති විශාරදයන්ගේ උපදෙස් පැතීමට සිදු වූ පළමු මිනීමැරුම් නඩුව බවට පත්වූයේ ද සතාසිවම් ඝාතන නඩුවයි. කොටස් දෙකකින් යුත් සතාසිවම් නඩුවේ අවසන් කොටසයි මේ.**

**සතාසිවම් මහත්මියගේ ඝාතනයෙන් දින දහයකට පමණ පසු මෙතෙක් අතුරුදන්ව සිටි විලියම් මාතර දී පොලිස් භාරයට ගැණුනු අතර ප්‍රශ්න කිරීම් හමුවේ ඔහු පොලිසියට කළ ප්‍රකාශය විමර්ශනයන්ට වඩාත් වැදගත් විය.**

ඝාතනය සිදු වූ දින පෙ.ව. 9.30ට පමණ සතාසිවම් යුවල නිදන කාමරයේ දී විශාල ආරවුලකට මුල පිරූ බවත් ඒ වන විට සතාසිවම් මහත්මිය සතාසිවම් මහතාට එරෙහිව දික්කසාද නඩුවක් ගොනු කර තිබූ හෙයින් එය ඉවත්කර ගන්නා ලෙස ඔහු ඇයට තර්ජනය කළ බවත් විලියම් පැවසීය. සතාසිවම් මේ ගැටුම අවසානයේ බිරිය ඇඳ මතට තල්ලු කොට බිරියගේ ගෙල වැරෙන් පෑගූ බව තමන් දුටු බවත් ඔහු වැඩිදුරටත් විමර්ශන නිලධාරින්ට පවසා තිබිණි.

විලියම්ගේ සිරුරේ තිබුණු සීරීම් තුවාල ගැන පොලිසිය සොයා ගත් කරුණු විමසීමේ දී විලියම් පොලිසියට කියා තිබුණේ සතාසිවම් මහතා ඒ වනවිටත් පණ අදිමින් සිටි සතාසිවම් මහත්මිය ඔසවා ගෙන ගරාජයට පැමිණෙන ලෙස තමාට විධානය කළ බවය. එසේ ඇගේ සිරුර ඔසවාගෙන එන අවස්ථාවේ දී එම සීරීම් තුවාල සිදු වූ බව ද ඔහු පොලිසියට ප්‍රකාශකර තිබිණි.



ලෝ සුපතළ අධිකරණ වෛද්‍ය සිඩ්නි ස්මිත්

ඒ වනවිටත් සතාසිවම් මහත්මියගේ වටිනා ආභරණයක් අතුරුදන් වී තිබූ අතර වැඩි දුර සොයා බැලීම්වලදී එය විලියම් විසින් විකුණා ඇති බවට පොලිසියට සාක්ෂි ලැබී තිබිණි. ඒ ගැන විලියම්ගෙන් කළ විමසීමේ දී ඔහු පොලිසියට පවසා සිටියේ 'කට වසාගෙන සිටින ලෙස' පවසා සතාසිවම් මහතා විසින් එය තමාට 'තෑගි කළ' බවයි.

විලියම්ගේ සාක්ෂිය සහ කුලී රථ රියදුරාගේ සාක්ෂිය එකිනෙකට පරස්පර වීම නිසා අධිකරණය ද දැඩි ගැටලුකාරී තත්ත්වයකට පත්විය. මේ අතර සතාසිවම් මහත්මියගේ ඥාතීන් ප්‍රකාශ කර සිටියේ දික්කසාද නඩුව සතාසිවම් මහත්මියගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් කිරීම හේතුවෙන් යම් හෙයකින් එය පැරදුණහොත් විශාල මුදලක් වන්දි ලෙස සතාසිවම් මහත්මියට ගෙවීමට සිදු වන නිසා සතාසිවම් විසින් මෙම ඝාතනය සිදු කර ඇති බවත් එය සැඟවීමට කුලී රථ රියදුරුට මුදල් ලබා දී ඔහු නම්මවා ගෙන ඇති බවත්ය. මෙම



මහාදේවන් සතාසිවම් සිය නඩුව වෙනුවෙන් පෙනී සිටි ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ඇතුළු නීතිඥයන් සමඟ

## විලියම්ගේ සහ ටැක්සි රියැදුරුගේ සාක්ෂි පරස්පරයි

හේතු සලකා බැලීමේ දී සතාසිවම් වෙත නැවත සැකය එල්ල විය. මහාචාර්ය ද සේරම්ගේ අධිකරණ වාර්තාව විලියම්ගේ කට උත්තරය සමඟ නොසැසඳීම සහ සතාසිවම් මහත්මියගේ වස්ත්‍රයෙහි ශුක්‍රාණු පැල්ලමක් නිරීක්ෂණය වීම මේ අවස්ථාවේදී පරීක්ෂණය වෙනත් අතකට ගෙන යන්නට සමත් විය.

අද වන් තාක්ෂණය දියුණුව නොතිබූ අවධියක එය කාගේදැයි සොයා ගැනීමට නොහැකි වීමෙන් වඩාත්ම සිදු විය හැකි සිද්ධිය ලෙස නිශ්චිත වූයේ එම ශුක්‍රාණු විලියම්ගේ බවයි. ඒ වනවිට ලැබුණු තොරතුරු හා සාක්ෂි අනුව නිවසේ මෙහෙකරු හෙවත් දැනට චෝදනා ලැබ සිටින විලියම් ලිංගික අඩත්තේට්ටම් කිරීම සහ ආභරණ සොරා ගැනීම උදෙසා මෙම ඝාතනය සිදු කර ඇති බවට නිගමනය විය. එය එසේ වුවද සතාසිවම් මහත්මියගේ පාර්ශ්වයෙන් එය පිළිගැනීමට මැලි වූ අතර ශ්‍රී ලංකා අධිකරණ වාර්තාවේ මරණය සිදු වූ වේලාව ආසන්න මිනිත්තුවට නිශ්චය කර නොතිබීම ද ඔවුන්ගේ වාසියට හේතුවක් විය.

මේ ගැටලුකාරී තත්ත්වය නිසා මෙම ඝාතන නඩුව මෙරට අධිකරණයට පවා විසඳා ගත නොහැකි වූ අතර සතාසිවම් ජාත්‍යන්තරව ප්‍රසිද්ධියට පත්ව සිටි 'චරිතයක්' වූ නිසාම ඒ වන විට මෙම නඩුව ජාත්‍යන්තරයේ ද අවධානයට ලක්ව තිබිණි. එනිසාම මෙය විසඳා ගැනීම සඳහා ලෝ සුපතළ අධිකරණ වෛද්‍ය 'සිඩ්නි ස්මිත්' මෙරටට කැඳවීමට ද තීරණය විය.

සාක්ෂි සියල්ල දැඩි විමර්ශනයට ලක් කළ සිඩ්නි ස්මිත් අවසන් නිගමනය ලෙස නිශ්චිතව ප්‍රකාශයට පත් කරනු ලැබුවේ මෙම මරණය සිදු වී ඇත්තේ උදෑසන 11න් පසුව බවයි. ඒ වනවිට සතාසිවම් නිවසින් පිට වී සිටි බවට මේ වන විටත් ඕනෑතරම් සාක්ෂි ගොනු වී තිබිණි. සතාසිවම්ට එරෙහිව පැහැදිලි සාක්ෂියක් නොමැති විය. මේ සියලු කරුණු තම සේවාදායකයාගේ වාසියට ගොනු කරගත්



ලොව ප්‍රකට ක්‍රිකට් ක්‍රීඩක සර් ගාෆීල්ඩ් සෝබර්ස් සමඟ

විත්ති පාර්ශ්වයේ නීතීඥ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ඉතා දක්ෂ අන්දමින් නඩුව මෙහෙයවමින් තම සේවාදායක සතාසිවම් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කරගනු ලැබීය.

කෙසේ හෝ දියණියන් සිවුදෙනකුට ආදරණීය මවක් අහිමි කරමින් සිදු කළ මේ අමානුෂික ඝාතනය සිදු කළේ කවුරුන්ද යන්න නිශ්චිත ලෙස අනාවරණය වීමක් නොමැතිවම නඩුව අවසන් විය. මෙය මෙසේ නොවිසඳීම සැඟවී ගියේ නීතීඥයාගේ දක්ෂතාව නිසා ද? එසේත් නැතිනම් සාක්ෂි තිබියදීත් එය නිසියාකාරව ඔප්පු කර ගැනීමට තරම් සුදුසු මට්ටමට තාක්ෂණය දියුණු නොවූ නිසා ද යන්න අදට ද ගැටලුවකි. බොහෝ දෙනා විශ්වාස කළ පරිදි සැකය සතාසිවම් දෙසට

## ලෝ සුපතල අධිකරණ වෛද්‍ය සිඩ්නි ස්මිත් විමර්ශනයට කැඳවයි

එල්ල වුවද ඔහු සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කිරීම හේතුවෙන් කෝපයට පත් ජනතාව මිනීමැරුම අසල වංගෙඩියක් තිබීම හේතුවෙන් මෙය වං ගෙඩිය සිදු කළ මිනීමැරුමකැයි උපහාසාත්මකව නම් කිරීමට පවා පෙලඹිණි.

සියලු චෝදනාවලින් නිදහස් වූ සතාසිවම් හට බිරියගෙන් විශාල දේපළක් ද හිමි වූ අතර ඔහු ඒවා ද විකුණා දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන ආ අනියම් විදෙස් පෙම් සබඳකම මල්ඵල ගන්වමින් සිය පෙම්වතිය විවාහ කරගෙන විදෙස්ගත වූ බව ද සඳහන් වේ. සත්‍ය අදට ද සැඟව ගොසිනි. වර්තමානයේ මෙවන් දෙයක් සිදු වූයේනම් ඕනෑ තරම් විසඳුම් තිබෙන බව රහසක් නොවේ. පොලිසියේ වත්මන් ක්‍රියාකාරීත්වය මෙන්ම තාක්ෂණයේ දියුණුව අද වන විට අපරාධවල හතුරකු බවට පත්වී තිබීම කිසිවකු අපරාධයක් කරන්නට පෙර එක් වරක් නොව සිය දහස්වර සිතීමට පොලඹ වන්නකි.

**සකස් කළේ - නාමලී ගමගේ**



රත්රන් සඟවා ගෙන ආ ව්‍යාජ ක්‍රෙඩිට් කාඩ් තොගය

අත්අඩංගුවට ගත් රත්රන් සහ රත්තරන් ජෙල් තොගය

# ඉන්දියාවෙන් මෙරටට ගෙනා රත්තරන් ක්‍රෙඩිට් කාඩ්

■ ටී.කේ.ජී. කපිල – කටුනායක

**ඇය 30 හැවිරිදිය. ඕ ගම්පහ, කඩවත ප්‍රදේශයේ පදිංචි කාන්තාවකි. ඇය නිතර මෙරට සහ ඉන්දියාව අතර ගුවන් ගමනේ යෙදුණේ ව්‍යාපාර කටයුතු සඳහාය. මේ කාන්තාවගේ ඉන්දීය ගුවන් ගමන් පිළිබඳව ඉන්දීය ආදායම් බුද්ධි අංශයේ ( Directorate Of Indian Revenue Intelligence) නිලධාරීන්ගේ සුවිශේෂී අවධානය දීර්ඝ කාලයක් යොමු වී තිබුණේ දිගින් දිගටම ඇය ඉන්දියාවට පැමිණීමේ රහස කුමක්දැයි අනාවරණය කර ගැනීම සඳහාය.**

මෙසේ ඉන්දීය බුද්ධි නිලධාරීන් මේ ශ්‍රී ලාංකික කාන්තාව පිළිබඳව විමසිල්ලෙන් සිටිය දී ඇය 'සිය ගුවන් ගමන් ජාලය' එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි දක්වා ව්‍යාප්ත කළාය.

මේ සිදුවීම පිළිබඳව විශේෂ අවධානයෙන් පසු වූ ඉන්දීය ආදායම් බුද්ධි අංශයේ නිලධාරීන් වහාම මේ පිළිබඳව ශ්‍රී ලංකා රේගුවේ ආදායම් අධීක්ෂණ අංශයේ නිලධාරීන් වෙත දැනුම් දීමට පියවර ගත්තේය. ඒ මෙරට මේ වන විට පුද්ගල ආදායම් බුද්ධි තොරතුරු විමර්ශන ඒකකයක් නොමැති නිසාය.

ඒ අනුව මෙරට ශ්‍රී ලාංකික රේගු නිලධාරීන් කණ්ඩායමක් මේ කාන්තාව දැවැන්ත රන් ජාවාරමක් සිදු කරන බවට තොරතුරු අනාවරණය කරගෙන ඇය ඉන්දියාවේ සිට මෙරටට පැමිණෙන නුදුරු දිනයක් තෝරා ගෙන වැටලීම සඳහා කටුනායක ගුවන් තොටුපළ පැමිණීමේ පර්යන්තයේ රැඳී සිටියේ හොඳ ප්‍රතිඵලයක් බලාපොරොත්තුවෙනි.

ඉන්දියාව මෙම ජාවාරම් මර්දනයට දැඩි පියවර අනුගමනය කරන බැවින් මෙම රන් ජාවාරම මෙහෙයවන්නන්, ඉන්දියාව ඔස්සේ මෙරටට රන් ගෙන ඒමට සැලසුම් කර තිබුණේ ඉන්දියාවේ සිට පැමිණෙන ගුවන් මගීන් මෙවැනි ජාවාරම් සිදු නොකරතැයි රේගු නිලධාරීන් මූලික උපකල්පනයක නිමග්නව සිටින බව අත්දැකීමෙන් දන්නා නිසාය.

මේ කාන්තාවට නිතර මෙසේ ඉන්දියාවට ගුවන් ගමන්වල නිරත වීම සඳහා මුදල් නොමැති බවද, ඇය මෙම රත්තරන් ජාවාරම මෙහෙයවන ප්‍රධානියකුගේ අතකොලුවක් බවට තොරතුරු ශ්‍රී ලංකා රේගු ආදායම් අධීක්ෂණ අංශයේ නිලධාරීන් විසින් ඒ වන විටත් අනාවරණය කර ගෙන තිබුණි.

ඒ ඉකුත් 13 වැනි දා අලුයම් කාලයයි. කටුනායක ගුවන් තොටුපළ පැමිණීමේ පර්යන්තයේ වේලාව අලුයම 01.52 වන විට ගුවන් තොටුපළ වෙත ඉන්දියාවේ චෙන්නායි නුවර සිට ඉන්දීය ගුවන් සේවයේ ඒ.අයි.- 273 දරන ගුවන් යානය පැමිණ තිබිණි.

ශ්‍රී ලංකා රේගු ආදායම් අධීක්ෂණ අංශයේ නිලධාරීන් පිරිසක් ශ්‍රී ලංකා රේගු ඉතිහාසයේ දැවැන්ත මෙහෙයුමක් සඳහා කටුනායක ගුවන් තොටුපළ ඇතුළත ඒ වන විට ස්ථානගත වී සිටි අතර, ඒ පිළිබඳව හෝඩුවාවක් පෙර කී ගම්පහ කඩවත ප්‍රදේශයේ පදිංචි ගුවන් මගී කාන්තාව වෙත සහ ඇය පැමිණි ඉන්දීය ගුවන් යානය වෙත ද ලැබී තිබුණි.



වැටලීම සිදුකළ නිලධාරී කණ්ඩායම

එපමණක් ද නොව ඇය විසින් නීතිවිරෝධී ලෙස රැගෙන එනු ලබන රත්තරන් තොගය කටුනායක ගුවන් තොටුපළෙන් හොර රහසේ පිට කිරීම සඳහා එම ගුවන් යානය ඇතුළත්, ගුවන් තොටුපළ සංක්‍රමණික ගුවන් මගී පර්යන්තය සහ තීරු බදු රහිත සාප්පු සංකීර්ණය තුළත් තවත් විශේෂ පුද්ගලයන් කීප දෙනෙකුම රැඳී සිටියේ, මෙම රන් ජාවාරමේ ප්‍රධානියකුගේ උපදෙස් සහ අධීක්ෂණය යටතේය.

මේ සියලු සූදානම් පිළිබඳව කල් තියා දැනගෙන සිටි රේගු නිලධාරීන් පිරිස මෙම ගුවන් මගී කාන්තාව අසලට ළං වන්නට අනෙකුත් පුද්ගලයන්ට ඇති ඉඩ ප්‍රස්ථා මඟ හැරෙන පරිදි සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළේ කිසිවකුට නොදැනෙන පරිදිය.

මේ නිසාම ඇගේ සියලු ප්‍රයත්නයන් ව්‍යවර්ථව ගොස් තිබූ අතර, ඇය ඒ වෙනුවට ගුවන් යානයෙන් බැස ගත් පසුව, බොහෝ වේලාවක් ගුවන් තොටුපළ පැමිණීමේ පර්යන්තයේ රේගු පරිශ්‍රය වෙත නොපැමිණ, තීරු බදු රහිත සාප්පු සංකීර්ණයේ රැඳී සිටිමින් සිය සගයන් වෙත, තමන් රැගෙන විත් ඇති රත්තරන් තොගය හුවමාරු කිරීමට උත්සාහ කළාය. රේගු නිලධාරීන් ඒ වන විටත් තමන්ගේ චර්යාව හොඳින් නිරීක්ෂණය කරමින් සිටින බව ඇය නොදැන සිටියාය.

එහෙත් ඇගේ මෙම සියලු උත්සාහයන් ව්‍යවර්ථව ගොස් තිබූ අතර, ඇය මෙවර මෙම රත්තරන් තොගය මෙරටට නීතිවිරෝධී ලෙස රැගෙන ඒම සඳහා මෙතෙක් අත්හදා නොබැලූ විශේෂිත ක්‍රමයක් භාවිත කරමින් සිටියාය. එය කටුනායක ගුවන් තොටුපළ රේගු ඉතිහාසයේ මෙන්ම මෙරට රේගු ඉතිහාසයේ ද රේගු නිලධාරින්ට අමුතුම අත්දැකීමක් ලබා දුන් වංචනික ක්‍රමවේදයකි.

එනම් විවිධ වාණිජ බැංකු විසින් නිකුත් කරන ක්‍රෙඩිට් කාඩ්පත්වල අනුරුවට සෑම ආකාරයකින්ම සමාන වන ආකාරයට සැකසූ 'රත්තරන් කාඩ්පත්' කැරට් 24 රත්තරන්වලින් නිර්මාණය කර තිබුණි. මෙවැනි රත්තරන් කාඩ්පත් 27ක් ඇගේ අත් බෑගයේ තිබුණු පොලිතීන් උරයක බහා තිබුණි. පිටතින් ක්‍රෙඩිට් කාඩ්පත් සේ පෙනුණත් ඇත්තටම මේවා සකස් කර තිබුණේ පිරිසුදු රන්වලිනි. ඇය රේගු නිලධාරින්ගේ භාරයට ගැනෙන්නේ ඉන් පසුවය.

රේගු නිලධාරීන් ගුවන් මගීන් රැගෙන එන අත් බෑගයන් විශේෂයෙන්ම කාන්තාවන් රැගෙන එන අත් බෑගයන් පරීක්ෂා කිරීම සාමාන්‍යයෙන් සිදු නොකරන්නේ ඒවා තුළ ඔවුන්ගේ පෞද්ගලික පරිහරණයට අදාළ බඩුබාහිරාදිය තිබිය හැකි බැවින් වන අතර, මේ බැව් දැන සිටි මෙම කාන්තාව ඇතුළු ජාවාරම්කරුවන් පිරිස මෙසේ මෙම රත්තරන් ක්‍රෙඩිට් කාඩ් තොගය ඇගේ අත් බෑගය තුළ රැගෙන ඒමට පියවර ගෙන තිබුණි.

මීට අමතරව ඇය සිය ගමන් බෑගයේ තවදුරටත් කැරට් 24 රත්තරන්වලින් නිමා කළ මාළ, වළලු සහ මුදු තොගයක් ගෙනැවිත් තිබූ අතර, මේවා සියල්ලේ මුළු බර කිලෝ ග්‍රෑම් 06 යි ග්‍රෑම් 500 ක් වූ අතර ඒවායේ වටිනාකම රුපියල් එකොළොස් කෝටි පහළොස් ලක්ෂ පනස් දහසක් බව හෙළි විය.

**ශ්‍රී ලාංකික ජාවාරම්කාරිය කටුනායකදී රේගු දැලට කොටු වූ හැටි**

මෙරට මෙන්ම සමස්ත ලෝකවාසී ජනතාව සිය පරිහරණය සඳහා භාවිත කරන්නේ කැරට් 22 ස්වර්ණාභරණ වන අතර, ජාවාරම්කරුවන් මෙරටට නීතිවිරෝධී ලෙස ගෙන එන රත්තරන් කැරට් 24 ඒවාය. ඒවාට 'මාත්තු යොදා' කැරට් 22 රත්තරන් සකස් කරනු ලබයි.

එසේම මෙම නීතිවිරෝධී රත්තරන් ජාවාරම මැඩ පැවැත්වීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් මෙරටට කැරට් 24 රත්තරන් ගෙන ඒම තහනම් කරමින් අති විශේෂ චක්‍රලේඛයක් ද පසුගිය සතියේ නිකුත් කිරීමට පියවර ගෙන තිබුණි.

මීට අමතරව ඇගේ අත් බෑගය තුළ කළු පැහැති සෙලෝටේප්වලින් ඔතන ලද රත්තරන් ජෙල් ( Gold Jel) තොගයක් ද තිබූ අතර, ඒවායේ බර කිලෝ ග්‍රෑම් 02 යි ග්‍රෑම් 200 ක් විය. එහි වටිනාකම ජාතික ස්වර්ණාභරණ අධිකාරිය විසින් තක්සේරු කර නොමැති අතර, මෙම ජෙල් තොගය ද රුපියල් තුන් කෝටි පනස් ලක්ෂයක් පමණ වටිනාකමකින් යුතු බව රේගුව තක්සේරු කර තිබේ. ඒ අනුව මෙසේ නීතිවිරෝධී ලෙස මෙම කාන්තාව ශ්‍රී ලංකාවට ගෙන ආ රත්තරන් තොගයේ වටිනාකම රුපියල් දහ හතර කෝටි පහළොස් ලක්ෂ පනස් දහසකට වැඩි වටිනාකමකින් යුක්ත විය හැකි බව රේගු නිලධාරීන් ප්‍රකාශ කරති. එසේම මෙම කාන්තාව ඉතා කෙටි කාලයක් ඇතුළත මේ ආකාරයට ඉන්දියාව ඔස්සේ ඩුබායි සිට සිවු වතාවක් පැමිණ ඇති බව රේගු ආදායම් අධීක්ෂණ අංශයේ නිලධාරීහු සිදු කළ මූලික විමර්ශනවලදී අනාවරණය වී තිබේ.

මේ පිළිබඳ වැඩිදුර විමර්ශන කටයුතු රේගු ආදායම් අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ ඩී.බී.එන්. සමරතුංගගේ උපදෙස් මත නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ නලීන් ප්‍රේමරත්නගේ අධීක්ෂණයෙන් රේගු අධිකාරී මාලක විජේසේකර, ස්ථාන භාර නිලධාරී අරුණ ශාන්ත අමරසිංහ, සහකාර රේගු අධිකාරීවරුන් වන ගයාන් රංග කුමාර, අමිල රත්නායක, රුචිර ජීවානන්ද, ගයාන් රාජරත්න, දිල්රුක්ෂි ගුණතිලක, දක්ෂිත අලහකෝන්, රේගු පරීක්ෂක නිමේෂ් අධිකාරී, රේගු නියාමකවරුන් වන විෂාන් කාවින්ද සහ මලිත් සමරකෝන් යන නිලධාරිහු සිදු කළහ.

මේ පිළිබඳ විධිමත් රේගු පරීක්ෂණය නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ සංජය රවීන්ද්‍ර විසින් පවත්වා තිබූ අතර, එහිදී මෙසේ නීති විරෝධී ලෙස රැගෙනවිත් තිබූ සියලු රත්තරන් රාජසන්තක කිරීමට නියෝග කිරීමට නියෝග කළ අතර මීට අමතරව රුපියල් ලක්ෂ පහක දඩ මුදලක් ගෙවන ලෙසද අදාළ කාන්තාවට නියෝග කර තිබේ.

2023 පෙබරවාරි 5 ඉරිදා





# යන්න ගියා දෙන්නම මේ ලොවෙන් සමුගෙන

එච්.ඒ.පී. සමරවික්‍රම – මැදමුලන සමූහ



මධූෂා සහ අජිත්

**අජිත්ට 'මධූෂා' මුණ ගැසෙන්නේ අහම්බෙනි. ඒ තංගල්ල නගරයේදීය. ඇය දුටු පළමු දිනයේම අජිත්ගේ සිතට දැනුණේ සසරේ කෙදිනක හෝ ඇය හමු වූවාක් වැන්නකි. තංගල්ල බස් නැවතුම්පොළ අසලදී දුටු ඒ 'රුව' යළි දකින්නට ඇත්නම් යැයි අජිත්ට සිතෙන්නට ඇත. පසු දිනද සුපුරුදු වෙලාවට බස් නැවතුම්පොළ වෙත ගියද ඒ රුව දකින්නට නොලැබිණි. අජිත්ගේ සිතට දැනුණ 'සාංකාව' මෙපමණකැයි කිව නොහැකිය. එක දිගට දින කිහිපයක්ම උදේ සහ සවස ඒ 'රුව' දැක ගැනීමේ අපේක්ෂාවෙන් ඔහු බස් නැවතුමේ කැරකිණි. දින දෙකකට පසුව අජිත්ට සතුටක් දැනුණේ තමන් සෙවූ 'රුව' දකින්නට ලැබීමෙනි. කීප වරක් ඇය අසලින් ගිය 'අජිත්' ඇය දෙස බලා සිනාසුණේ ඇගෙන්ද පිළිතුරු සිනාවක් ලැබේයැයි සිතමිනි. දෙදෙනාගේ 'නෙත්' එකිනෙක ගැටුණද ඇගෙන් ඔහුට පිළිතුරු සිනාවක්නම් නොලැබිණි. මඳ වෙලාවක් අජිත් දෙස බලා සිටි 'මධූෂා' කිසිම ප්‍රතිචාරයක් නොදක්වා බිම බලාගෙන සිටියාය. දින කිහිපයක් පැමිණ ඇය දෙස බලා සිනාසී ඇයට ඇති ආදරය පෙන්වීමට, උනන්දුවක් ඇති බව පෙන්වීමට අජිත් උත්සාහ ගත්තේය. දින කිහිපයකට පසුව 'මධූෂා'ගෙන් 'යන්තම් සිනාවක්' අජිත්ට ලැබිණි.**

එදා අජිත් එතැනින් පිටතට ගියේ අප්‍රමාණ සතුටකිනි. ඊළඟ දිනයේ අජිත් ඇය අසලට ගොස් සිනාසී ඇයට ළං විය. ඔහුගේ වචන පැටලෙද්දී යන්තම් සිය අදහස ඇයට කියාගන්නට අජිත්ට හැකි විය. මධූෂා ඇය ගැන අජිත් ඇසූ තොරතුරුවලට පිළිතුරු දුන්නේ අජිත් දෙස බලාගෙන නම් නොවේ. ඇය වටපිට බලමින් ඊට පිළිතුරු දුන්නාය. තංගල්ලට ඇය පැමිණෙන්නේ අම්බලන්තොට සිට බැවින් තමන් දන්නා හඳුනන කවුරුන් හෝ සිටීදැයි ඇය විපරම් කළාය. දිනෙන් දින දෙදෙනා එකිනෙකා සමඟ කතා බස් කරද්දී දෙදෙනාගේ 'ආදරය' මල්පල ගැන්විණි.

මධූෂා අම්බලන්තොට පදිංචි වයස අවුරුදු දහසයක තරුණියකි. ඇය තංගල්ලට පැමිණෙන්නේ පෞද්ගලික පන්තියකට සහභාගී වන්නටය. ඇය අජිත් සමඟ පෙම් සබඳතාවක් ආරම්භ කරන්නේ මේ අතරය. අජිත් යනු තංගල්ල නගරයේම හැදී වැඩුණ තරුණයෙකි. පියෙකුගේ සෙනෙහස අහිමිව කුඩා කාලයේ සිටම මව ළඟ හැදී වැඩෙන අජිත්ට පාසල් අධ්‍යාපනයක්ද නිසියාකාරව ලබා ගන්නට නොහැකි විය. ඔහුගේ මව තංගල්ල නගර සභාවේ කම්කරුවෙකු ලෙස සේවය කළාය. වයස අවුරුදු අට දහය වෙද්දී මවගේ දැනහැඳුනුම්කම මත අජිත් සංචාරක හෝටලයක හිමිකරුවෙකුගේ නිවෙසකට භාර දුන්නාය. ඒ ඇයට දරුවෙකු හදා වඩා ගන්නට මෙන්ම පෝෂණය කරන්නට තරම් ආර්ථික ශක්තියක් නොමැති බැවිනි.

**උප්පැන්න සහතිකයක් නැති නිසා විවාහ වෙන්න නොහැකි වේ යැයි පෙම්වතා බියෙන් පසුවෙලා**

අජිත් උපතින්ම දෙමළ ජාතිකයෙක් වන අතර ඔහු හැදී වැඩෙන්නේ සිංහල පවුල් අතරය. ජාතිභේදයක් ඔහුට නොදැනිණි. යහළු මිත්‍රයන් සියල්ල ඔහුට සහෝදරයන් සේය. තමන්ට රැකවරණය සලසන පෝෂණය කරන ස්වාමියා වෙනුවෙන් අජිත් උපරිම කැපවීමකින් වැඩ කළේය. සංචාරක හෝටලයක් හිමි ස්වාමියා අජිත්ට හෝටලයේ සියලු වැඩ පැවරුවේ අජිත් තුළ තිබූ විශ්වසනීයභාවය නිසාමය.

කාලයක් ගතවෙද්දී අජිත් එම සංචාරක හෝටලයේ සියලු කටයුතු සොයා බලමින් වැඩ කටයුතුවල නිරත වූ අතර ඊට හෝටල් හිමියාද නිදහස දී තිබිණි.

**ළාබාල යුවළගේ සිරුරු හෝටලයේ**

මේ සියල්ල සිදු කරන අතරම සිය පෙම් සබඳතාවද පවත්වාගෙන යන්නට අජිත් කටයුතු කළේ තමන් හඳුනා ගත් පෙම්වතිය අනාගත සහකාරිය බවට පත් කර ගන්නා අදහසිනි. කිසි විටෙකත් ඇය අත්හරින සිතක් අජිත් තුළ නොවීය. සිය පෙම්වතියගේ නිවෙසට ගිය අජිත් ඇයට සියල්ල පවසා සිටියේ තමන්ගේ සිත තුළ ඇති අවංක බව ඇයට පෙන්වමිනි. මධූෂාගේ මවද විදේශගතව සේවය කළාය. දෙදෙනාගේ ප්‍රේම සම්බන්ධය දැනගත් ඇය පවසා සිටියේ තමන් ලංකාවට පැමිණ විවාහය සිදුකර දෙන බවත් එතෙක් ඉවසා සිටින ලෙසත්ය.

අජිත් නිසි අධ්‍යාපනයක් ලැබූ අයෙකු නොවූ බැවින් ඔහු සිය මිතුරන් සමඟ තම විවාහය පිළිබඳව අනාගතය පිළිබඳව පවසමින් ඔවුන්ට අනාගත තම සැලසුම් ගැන පැවසුවේ ඔවුන්ගේ අදහස් උපදෙස්ද ලබා ගැනීමේ අදහසිනි. අජිත් තම පියා පිළිබඳව කිසිවක් නොදන්නා අතර මවගෙන් ඒ ගැන විමසන්නට ඔහු අකමැති විය. ඒ මවගේ සිත රිදවිය නොහැකි බැවිනි. ඔහු කිසි දිනෙක තමන්ගේ උප්පැන්න සහතිකයක් දැක නොතිබිණ. ඒ නිසාම පාසල් අධ්‍යාපනය ඔහුට අහිමි විය. ජාතික හැඳුනුම්පත පවා සකසා ගැනීමට ඔහුට නොහැකි විය. තරුණ වයසට පත් වන විට අජිත් මේ අඩුපාඩු නිසා කලකිරීමට පත් වී සිටියේය. සෑම තැනකදීම තමන්ට 'අඩුවක්' සහ මදිකමක් සිදු වන බව ඔහුට දැනිණි. තමන් ඇසුරු කළ අයගෙන්ද මීට නිසි විසඳුමක් ලබා ගැනීමට ඔහුට නොහැකි විය. ඒ ඔවුන්ටද අජිත්ට උපදේශයක් දෙන්නට තරම් දැනුමක් නොතිබූ බැවිනි.

'මධූෂාට' වයස අවුරුදු දාහතකි. ඇයට අවුරුදු දහඅට පිරුණු ගමන් විවාහ වීම අජිත්ගේ අපේක්ෂාව විය. එහෙත් තමන්ට උප්පැන්නයක් හෝ හැඳුනුම්පතක් නොමැති වීම ඊට බාධාවක් බව අජිත්ට ඇසූ ඇසූ අය පවසා තිබිණ.

නිසි දැනුමක් ඇති අයෙක්ගෙන් මේ පිළිබඳව අසන්නට තරම් දැනුමක්, අවබෝධයක්ද හෝ හැඳුනුම්කමක්ද අජිත්ට නොතිබිණ. මධූෂා සහ අජිත් විවාහය ගැන කතාවන සෑම අවස්ථාවකම මේ කාරණය පෙරට ආවේ දෙදෙනාගේම සිත්වලට වේදනාවක් උරුම කරමිනි. මධූෂාටද ලෝකය තේරුම් ගන්නට යමක් අවබෝධ කර ගන්නට තරම් හැකියාවක් දැනුමක් නොතිබිණ. ඇය වයස අවුරුදු දාහතක් වන තරුණියකි. අජිත් ද අධ්‍යාපනයක් නොලද අහිංසකයෙකි.

ඒ නිසා අජිත් සිතුවේ විවාහය සඳහා හැඳුනුම්පත සහ උප්පැන්නය නොමැති වීමේ හේතුව නිසා තම විවාහය සිදු කළ නොහැකි වේනම් තමන් පණ මෙන් ආදරය කළ 'මධූෂා' තමන්ට අහිමි වනු ඇති බවයි.

පසුගිය දිනක අජිත් - මධූෂා හමුවී දිගින් දිගටම මේ ගැන කතා කළේය. මධූෂා මවගේ සහ පවුලේ අදහස් ලෙස කීවේ 'අම්මා මෙරටට පැමිණි පසු කසාද බඳිමු' කියාය.

ඒ සෑම අවස්ථාවකම අජිත්ගේ සිත කීරි ගැසී යන්නට ඇත. තමන්ගේ අසරණකම අඩුපාඩු සිහියට නැගෙන්නටත් ඇත. මධූගේ ඥාතීන් ඉදිරියේ තමන්ට ලැජ්ජා වෙන්නට වේයැයි සිතෙන්නටත් ඇත. තමන්ගේ පළමු සහ එකම ආදර කතාව 'අහිමි කර ගන්නට' අජිත් අකමැති විය. අජිත් ඉතා අමාරුවෙන් තමන්ට ඇති හැඟීම, වේදනාව, භය මධූෂාට කීවේය.

"මධූ මට උප්පැන්නෙ හැඳුනුම්පත නැති නිසා කසාද බඳින්න බැරි වුණොත් ඔයා මට නැතිවෙනවා. මගේ 'පණ' මම ආදරේ කළේ ඔයාට විතරයි. ඒවා නෑ කියල මට ඔයා නැතිකර ගන්න බෑ. ඔයා වෙන කාටවත් අයිති වෙනවා මට බලන් ඉන්නත් බෑ. මේවට විසඳුමක් හොයන්න ලෝකයෙ මිනිස්සුන්ගේ ඇස් ඇරෙන්නත් එක්ක අපි දෙන්න මේ ලෝකෙන්ම සමු අරගමු" යැයි වෙව්ලන ස්වරයෙන් මධූෂාගේ අත අල්ලාගෙන පැවසීය. දෙදෙනාගේ ආදරය බැඳීම ඉතාම සවිමත් එකක් විය. මධූෂාටද අජිත් කී දේ ගැන බරපතළකමක් නොදැනිණි ආදරයෙන් අන්ධව සිටි දෙදෙනාම තමන් ගන්නේ ඉතාම නිවැරැදි තීරණය යැයි සිතන්නට ඇත.

දිනය පසුගිය 22 වන දිනයි. සවස හතරට පමණ අජිත් සිය ත්‍රිරෝද රථයෙන් අම්බලන්තොට ප්‍රදේශයේ පිහිටි නිවෙසට ගොස් ටික වෙලාවක් ගතකර, "මධූ පොඩි ගමනක් යමුද?" කියා කතා කර ඇය ත්‍රිරෝද රථයට නංවාගෙන තංගල්ලේ හෝටලය වෙත පැමිණියේය. සොඳුරු ආදර කතාවක නිමාව අරඹමින් දෙදෙනා එක්ව මෙලොවින් සමුගන්නට තීරණයකට එළඹිණි. සිය තීරණය කොළයක සටහන් කළ අජිත් 'අපි දෙදෙනාගේ ආදරය අවසන්... අපිට මෙහෙම වෙන්නේ අපේම කැමැත්තෙන්' යන අදහස දැනෙන ලිපියක් ලියා මේසය මත තබා, හෝටලයේ ආලින්දයේ බාල්කයක ලණු දෙක ගැට ගසන අජිත් තොණ්ඩු දෙකක් සකස් කර පුටුවක් අසලට ගෙන දෙදෙනාම එකට බදාගෙන පුටුවට නඟින ආකාරයද ගෙලට තොණ්ඩු දාගෙන පුටුව පාදයෙන් තල්ලු කරන අයුරුද හෝටලයේ සී.සී.ටී.වී. කැමරාවල මැනවින් සටහන්ව ඇත. හෝටල් හිමියා මෙය දකින්නේ පැය කිහිපයකට පසුවය.

වහාම තංගල්ල මූලස්ථාන පොලිසියට මේ බව දන්වන හෝටල් හිමියා අවශ්‍ය නීතිමය කටයුතු සඳහා සිය දායකත්වය ලබා දෙන ලදි. පොලිස් පරීක්ෂණ ආරම්භ කර තංගල්ල ස්ථානීය අපරාධ ඒකකයේ නිලධාරින්ද පැමිණ පරීක්ෂණ ආරම්භ කරන ලදි. පොලිසියේ දැන්වීම මත තංගල්ල මහේස්ත්‍රාත් හේමන්ත පුෂ්පකුමාර පැමිණ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර වැඩිදුර පරීක්ෂණ සඳහා මෘත දේහ තංගල්ල අධිකරණ වෛද්‍යවරයා වෙත යොමු කරන ලෙස පොලිසියට නියෝග කරන ලදි.

නීතිය නොදැනීමද, අනවබෝධයද, නිසි උපදෙසක්, මඟ පෙන්වීමක් ලබා ගත නොහැකිවීම ද මත අහිංසකයන් දෙදෙනකුට ආදරය වෙනුවෙන් ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදුවීම කොතරම් ඛේදනීයදැයි විමසීම විසඳුම් සෙවීම සමාජ යුතුකමකි.



අසල්වාසි නිවෙසට රිංගා රන් මුදල් භාණ්ඩ උස්සලා

නිවෙසට ඇතුළු වන්නේ දියණියත් සමඟ

# දියණිය සොරකු කළ කුඩු ජෝඩුව

සැකකරු සැකකාරියගේ තුන්වැනි සැමියා

කනංකේ පොලිසියෙන් ඇසුණු කතාවක්

■ ටී.කේ. මහින්ද - වැලිගම සමූහ

**ගාල්ල දිසාවේ ඉමදූව 'මිනිමරුව' ප්‍රදේශය කනංකේ පොලිස් ස්ථානයෙන් පාලනය වන්නකි. එහෙත් මේ ගම්මානය යක්කලමුල්ල හා ඉමදූව පොලිස් වසමටම යාබදව පිහිටා ඇත්තේ පොලිස් මායිම් සලකුණු කරමිනි. අතීතයේ නම් වචනයේ පරිසමාප්ත ආර්ථයෙන්ම අපරාධ සම්බන්ධයෙන් ද මේ ගමට නමක් පටබැඳී තිබිණි. එහෙත් මීට දසක ගණනාවක සිට මේ ප්‍රදේශය ජීවත්වීමට සුදුසු වටපිටාවක් ඇති සුන්දර ගම්මානයක් බවට ප්‍රකට විය. එහෙත් නව වසරේ උදාවත් සමඟ ඉකුත් 6 වැනිදා 'මිනිමරුව' ප්‍රදේශයේ නිවෙසක් බිඳ ඇති බව මුළු ප්‍රදේශය පුරාම රැව් දුන්නේය. කරාටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් ප්‍රකට ගුරුවරයෙකු වූ නිවෙසේ අයිතිකරු මේ සම්බන්ධයෙන් කනංකේ පොලිසියට පැමිණිල්ලක් කළේය. මෙය බොහෝ දෙනෙකුට ප්‍රහේලිකාවක් බවට පත් වූයේය. ඊට හේතු වූයේ එවැන්නක් මෑත කාලයේ ප්‍රදේශයෙන් වාර්තා නොවීමයි. කරාටේ ගුරුවරයාගේ නිවෙසින් සොරකම් කර තිබුණේ මුදල් සහ රන් අබරණය.**

මේ සිද්ධිය සම්බන්ධයෙන් කනංකේ පොලිසියට ලැබුණු පැමිණිල්ලකට අනුව වහාම ක්‍රියාත්මක වූ පොලිස් ස්ථානාධිපති එස්.එම්. චාමර සිල්වා, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පරීක්ෂක කාරියවසම් ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ ආරම්භ කරන ලදී. සැක කටයුතු කිසිවෙක් ගැන අවධානය යොමු නොවුවද, පොලිස් ස්ථානාධිපතිවරයා විසින් උපාය දූතයෙකු යොදවා මේ ගැන පරීක්ෂණ කටයුතු සක්‍රිය කළේය.

එහිදී අසල්වැසි නිවෙසක පදිංචිකරුවන් ගැන සැකයක් පොලිසියට මතු වූයේය. ඊට හේතු වූයේ සොරකම සිදුවීමෙන් පසුව අදාළ නිවසේ පදිංචිකරුවන් වැඩි වශයෙන් දක්නට නොලැබීමයි. එහෙත් ඔවුන්ගේ දියණියන් දෙදෙනා නිවෙසේ සිටින බව පොලිසිය සිදු කරන ලද මූලික පරීක්ෂණවලදී අනාවරණය කර ගැනීමට වැඩි කාලයක් ගත නොවීය. මේ දෙදෙනා වයස අවුරුදු 12 සහ 14 සීමාවේ පසු වූහ. සොරකමේ සුලමුල මුළුමනින්ම අනාවරණය කර ගැනීමට පොලිසියට හැකි වන්නේ ඉන් පසුවය.

මේ ගැන තවදුරටත් විමර්ශන සිදු කිරීමේදී මේ දියණියන්ගේ මව 38 හැවිරිදි වියේ පසුවන බව හෙළි විය. ඇගේ පළමු විවාහයේ සැමියා පවුලෙන් වෙන්ව ගොස් තිබුණි. දෙවැනි විවාහයේ ස්වාමියා ද දුම්රියට පැන දිවි අහිමි කර ගෙන ඇති බව හෙළි විය. ඉන් පසුව මේ නිවසට අමුත්තෙකු එක්වූයේ මීට මාස තුනකට පමණ පෙරය. ඒ මේ කාන්තාවගේ තුන්වැනි සැමියාය. ඔහු නමින් අනුරාධ හෙවත් 'වාසු' ය. ඔහු ගාල්ල චීනකොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මේ පුද්ගලයා අදාළ කාන්තාවගේ නිවෙසට පැමිණ ගතවී තිබුණේ මාස තුනකටත් අඩු කාලයකි. ඔහු මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවකු බව මෙම කාන්තාව දැන සිටියේ ද නැත. එහෙත් මේ වන විට මෙම කාන්තාව ද මත්ද්‍රව්‍යයට ගොදුරුව ඇති බවට පොලිසිය සැක කරන්නේය. පවුලේ අගහිඟකම් වැඩි වන්නේ ඒ සමඟය.

කරාටේ ශිල්පියාගේ නිවසේ අය ඇතැම් අවස්ථාවන්හි නිවෙසින් බැහැරව සිටින බවට මේ අඹුසැමියනට නිරීක්ෂණය විය. ඉකුත් 6 වැනිදා එකී සැකය මතු වූ අතර මෙය පරීක්ෂා කිරීමට වාසු සමඟ 12 හැවිදිරි දියණියද අල්ලපු නිවෙසට ගියාය. පළමුව මේ දෙදෙනා නිවෙස අවට විපරම් කළ අතර නිවැසියන් නැති බව තවදුරටත් සනාථ කර ගැනීමට වහලට ගලක් විසි කරන ලදී.

මේ අනුව නිවෙසේ කිසිවකු නොමැති බව සනාථ කර ගත් ඔවුහු නිවෙසට ඇතුළු වූහ. කලින් සැලසුම් කරන ලද පරිදි වාසු දියණියට පවසා තිබුණේ එම නිවසේ කිසිවකු හෝ සිටියහොත් නිවෙසට සර්පයෙකු ඇතුළු වූ බව පැවසීමට එහි පැමිණි බව කීමටය.



විමර්ශන සිදුකළ කණ්ඩායම

පොලිසිය අදාළ දරුවන්ගෙන් ලද තොරතුරු පරිදි සැකකරු අත්අඩංගුවට ගැනීමට වැඩි කාලයක් ගත වූයේ නැත. මෙසේ සැකකාර අඹුසැමියන් අත්අඩංගුවට පත්වූයේ ගාල්ල ප්‍රදේශයේ ඥාතියෙකුගේ නිවෙසේදීය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී රන් ආභරණවලින් කොටසක් සොයා ගන්නා ලද්දේ රන් ආභරණ මිලදී ගන්නා ස්ථානයක තිබියදීය.

සොරා ගනු ලැබූ තවත් භාණ්ඩ කොටසක් අනුකරණ බව හෙළි වීම නිසා ඒවා සමඟ සොරකම් කරන ලද ටැබ් එකේ සිම්පත ද මෝඩ ඇළට විසි කරන්නට මේ යුවළ පියවර ගෙන තිබුණි. සොරකම් කරන ලද රත්තරන් භාණ්ඩවල වටිනාකම රුපියල් ලක්ෂ ගණනක් වූ අතර ඒවා විකුණා ලබා ගත් මුදල්ද මේ යුවළ මත්ද්‍රව්‍ය පානයට යොදා ගන්නට ඇතැයි පොලිසිය සැක කරයි. මේ වන විට කාන්තාවට තවත් දරුවෙකු පිළිසිඳ ගෙන ඇති අතර, ඒ නිසා ඇයගේ සායන වෙනුවෙන් වැය කිරීමට මේ මුදල් යොදා ගෙන ඇති බව වැඩිදුර විමර්ශනවලදී අනාවරණය කර ගැනිමට පොලිසියට හැකි විය. මෙහිදී ටැබ් පරිගණකය සොයා ගනු ලැබුවේ ඥාති නිවසක තිබියදීය. සැකකාර යුවළ මාතර මහේස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කළ අතර ඔවුන් ලබන 23 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.



කනංකේ පොලිස් ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එස්.එම්. චාමර සිල්වා



අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක කාරියවසම්

කනංකේ පොලිස් ස්ථානාධිපති එස්.එම්.චාමර සිල්වාගේ උපදෙස් පරිදි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පරීක්ෂක කාරියවසම්, පොලිස් කොස්තාපල් 72839 චන්ද්‍රකුමාර, කාන්තා කොස්තාපල් මහේෂිකා, 80184 කුමාර යන නිලධාරින් නිලධාරිනියන් සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලදී.

මේ වන විට දියණියන් දෙදෙනා වැඩිමල් දියණිය යටතේ රැකවරණය ලබති. එහෙත් වැඩිමල් දියණියගේ ආර්ථිකයද එතරම් යහපත් නැත. මේ හේතුවෙන් මෙම දරුවන් දෙදෙනා සම්බන්ධයෙන් ද ළමා ආරක්ෂක නිලධාරින්ගේ ද අවධානය වහා යොමු විය යුතුය.

විනිතා මානෙල් ගමගේ - හල්තොට සමූහ

# ජීවිතයක් බිලි ගත් විහිළුවක්

## නුගේගොඩ විජේරාම ගරාජ් සේවකයාගේ ඝාතනයට සැක විලී මාමා ඇතුළට

### මත්පැන් සාදය අතරතුරදී ධනුෂ්ක සහ විලී මාමා අතර ඇතිවූ ගැටුමෙන් පසු පළිගන්න කළ දෙයක්

**වසරක් ගෙවී නව වසරක් උදාවීම කාගේත් සිත්වල අලුත් බලාපොරොත්තු මෝදු වන අවස්ථාවක් ලෙස සැලකීම සිරිතය. සියල්ල අලුත් කර ගනිමින් එදිනට සූදානම් වීම ලොකු කුඩා මෙන්ම දුප්පත් පොහොසත් කියා බේදයකින් තොරවම කවුරුත් සිදු කරන ක්‍රියාවකි.**

මෙවැනි වැදගත් දිනයක් ඇතැම් පුරුෂ පක්ෂය සමරන්නේ මත්පැන් සාදයකට මුල් තැන ලබා දෙමින් වීම විශේෂිතය. එහෙත් 'පදම ඉක්මවන' සාදවල අවසන් ප්‍රතිඵලය බොහෝ දුර්විපාක ගෙන දෙන සිදුවීම්වලින් පිරිපූර්ණ වීම ස්වභාවිකය. එවැනි අවස්ථාවල වචනයෙන් දෙකෙන් ආරම්භ වන 'වාග් සංග්‍රාම' කඩු පොලු කිණිසි හරඹ දක්වා දිග්ගැස්සෙන්නේ පොලිස් පොතට අලුත් කතා මාලාවන් ද එකතු කරමිනි. මෙයද එවන් ශෝචනීය අයුරින් නිමාව දුටු සාදයක් වීම අවාසනාවකි.

"අනේ මහත්තයා අර ධනුෂ්කට කවුරුහරි ගහල ඇඳ ළඟ මැරිල වැටිල ඉන්නවා..."

නුගේගොඩ, විජේරාම 08 කණුව ප්‍රදේශයේ පිහිටි ගරාජයට එහි හිමිකරු උදෑසනින් පැමිණි විට සේවකයෙකු වන විලී මාමා පැවසුවේ ධනුෂ්කට සිදු වූ විපත අදහා ගැනීමට නොහැකි ලෙසය. එක කාමරයේ එකට සිටින දෙදෙනෙකු වන මොවුන්ගෙන් එක් අයෙකුට මෙවැන්නක් සිදු වීම අනෙකාට කෙසේවත් ඉවසා සිටීම අපහසු බව නොරහසකි.

හැටපස් හැවිරිදි විලී මාමා අදාළ ගරාජයේ රැකියාවට පැමිණ ඇත්තේ මීට වසර තුනකට පමණ පෙරය. දෙනියාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වූ ඔහුට ගරාජයේම කාමරයක් නවාතැන ලෙස ලබා දීමට හිමිකරු කටයුතු කළේ ඔහුගේ පහසුව ගැන සලකමිනි. ධනුෂ්ක එහි පැමිණියේ මීට වසරකට පමණ පෙරය. ඔහුටද විලී මාමාගේ කාමරයේම ඉඩක් ලැබුණේ ඒ අයුරිනි.

විසිතුන් හැවිරිදි කොණ්ඩදෙණිය පටබැඳිගේ සුරේෂ් ධනුෂ්ක දුෂ්කර ගම්මානයක් වන ගිරිබාව, සෝලෙ වැව, යාය 06, නො 206 පදිංචි අවිවාහක තරුණයෙකි. ඔහුට සිටින්නේ එක් වැඩිමහල් සහෝදරයෙකු පමණකි.

ධනුෂ්කගේ මව සහ පියා පුතුන් දෙදෙනා උස් මහත් කළේ ගොවිතැන් කටයුතු සිදු කරමින් සුළු මුදලක් උපයමිනි. ඒ නිසා ධනුෂ්කගේ කොළඹ සම්ප්‍රාප්තිය ඔවුන්ට මහමෙරක් තරමට වටිනා එකක් වීම අතිශෝක්තියක් නොවන්නේය.

මේ ගරාජයේ නැවතී රැකියාව කළේ ධනුෂ්ක සහ විලී මාමා පමණක් නොවේ. මනි මාමා ද නවාතැන් ගත්තේ එහිමය. ඔහුගේ කාමරය පිහිටා තිබුණේ උඩු මහලේය. ගරාජයේ තවත් සේවකයින් හය දෙනෙකු පමණ රැකියාව කළත් ඔවුන් උදේ හවස තම නිවෙස්වලට යන එන බැවින් රාත්‍රී කාලයට එහි ඉතිරි වන්නේ මේ තිදෙනා පමණය.

නව වසරේ උදාව කාගේත් සිත් සතුටින් පිරි ඉතිරී ගිය දිනයක් වූ බැවින් ගරාජයේ හිමිකරු කටයුතු කළේ සේවකයින්ට සාදයකින් සංග්‍රහ කිරීමටය. ඒ සඳහා වෙන් කෙරුණේ අලුත් අවුරුද්ද උදා වූ පසුගිය 01 වැනිදාය. කෑම බීම මෙන්ම මත්පැන්වලින්ද සාදය අඩුපාඩුවක් නොමැති වී ගියේ කාගේත් රස නහර පිනා යන පරිදි ය. ඒ සමඟම විහිළු තහළුවලින් සහ හිනාවෙන් ගරාජය තුළම පැවති සාදය තව තවත් හැඩවැඩ වී ගියේ කිසිවකුට නොදැනීමය.

මේ අතර කටකාර දඟකාර කෙළිලොල් තරුණයෙකු වූ ධනුෂ්කගේ විහිළු කතා එල්ල වී තිබුණේ විලී මාමා වෙතටය. වියපත් පුද්ගලයෙකු වූ විලී මාමාට ගැටයාගේ කතා හිතට ඇල්ලුවේ නැත. විහිළුවට විහිළුවෙන් උත්තර දෙනවා වෙනුවට ඔහු කළේ කොල්ලාට බැණ වැදීමය.

"වහගනිං උඹේ හැකර කට" ඔහු ධනුෂ්කට බැණ වැදුණේ ඒ නිසාය.

මෙමම වාග් ප්‍රහාර ටික ටික දුරදිග ගියේ කොල්ලාගේ ශක්තිමත් අතැඟිලි විලී මාමාගේ මුව හරහා පියඹා යෑමත් සමඟින්ය. හැට පැන්නත් මෙතෙක් ආරක්ෂිතව තිබූ දතක් අහිමි වී ඇති බව විලී මාමාට දැනුණේ තොල පුපුරා ලේ රස කටට දැනෙන විටය. දෙදෙනා දෙපසට කර ප්‍රහාර වළකා දැමීමට මනි මාමා කටයුතු කළත් එය සම්පූර්ණයෙන් නතර වුයේ නැත. රාත්‍රී හතහමාරට පමණ ගරාජ් හිමිකරු පැමිණ විරසකව සිටි විලී මාමාත් ධනුෂ්කත් සමාදාන කළේ දෙදෙනාටම තරයේ අවවාද කරමිනි.

"මූ මේ කරපු බලු වැඩේ මටනං අමතක වෙන්නෙ නෑ කීයටවත්ම. තාත්තා කෙනෙක් වගේ ඉන්න මටනේ අත ඉස්සුවෙ." මනි මාමා සමඟ එසේ පැවසූ විලී මාමා නින්දට ගියේ වෛරය හිතේ තද කරගෙන විය යුතුය. තවත් හෝරා කීපයක් මනි මාමා සමඟ ගත කළ ධනුෂ්ක රාත්‍රී 11.00ට පමණ නිදා ගන්නා විට විලී මාමා සිටියේ තද නින්දේ ගොරවමිනි.

උඩහමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන ගරාජයේ හිමිකරු ධනුෂ්ක මියගොස් ඇති පුවත මිරිහාන මූලස්ථාන පොලිසියට දැනුම් දෙන අතර ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. තුෂාර ඇතුළු නිලධාරින් විමර්ශන ආරම්භ


නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බී. ජී. එන්. ජයමහ


මිරිහාන මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ටී. එම්. තුෂාර


අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අමිල ගෝවින්න

කරන්නේ නුගේගොඩ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බී. ජී. එන්. ජයමහ, නුගේගොඩ කොට්ඨාස 1 භාර නිලධාරී කුමාර රූපසිංහගේ උපදෙස් හා මඟපෙන්වීම අනුවය.

මිරිහාන මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක සමඟ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක අමිල ගෝවින්න, උපපොලිස් පරීක්ෂක කුලරත්න බණ්ඩාර, කොස්තාපල්වරුන් වන 19363 සේනානායක, 92904 උදයංග, 95267 අජිත්, 103247 සචින්, 103675 ඒකනායක, ජයවර්ධන කාන්තා කොස්තාපල් 11854 හර්ෂනි, පොලිස් රියැදුරු 100988 පැතුම්, යන නිලධාරීන් විමර්ශන ආරම්භ කළේ අපරාධ ස්ථානයක් ලෙස එම ගරාජයේ කෙළවර මුල්ලේ ඇති මෙම කුඩා කාමරය කිසිවෙකුටත් ඇතුළු වීමට ඇති ඉඩ වළකා එය ආවරණය කරමිනි.

ධනුෂ්කගේ මළ සිරුර තිබුණේ ඇඳ පාමුල බිමය. ඔහුගේ හිස ප්‍රදේශයෙන් විශාල ලෙස රුධිරය ගලා ගොස් තිබුණේ තුවාල සිදුව ඇත්තේ ධනුෂ්කගේ හිසට වන බැවිනි.

ගරාජයේ සේවකයන්ගෙන් සහ හිමිකරුගෙන් සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා ගැනීම සිදු කෙරුණේ මේ ඝාතනය සිදු වී ඇති ආකාරය මෙන්ම එහි සුලමුල අනාවරණය කර ගැනීම සඳහාය. ධනුෂ්ක සමඟ එක කාමරයේ නිදා ගන්නේ විලී මාමා වන බැවින් ඔහුට නොදැනෙන ලෙස යම් අනතුරක් පිටස්තර කෙනෙකුට පැමිණ සිදු කිරීමට අසීරුය. එසේනම් ඔහු මේ ගැන යමක් දැනගෙන සිටිය යුතුය. නමුත් ඔහු ඒ සම්බන්ධයෙන් කිසිවක් දැන නොසිටීම පොලිස් නිලධාරින්ට ඇති කරන ලද්දේ ගැටලු සහගත තත්ත්වයකි.

එහෙත් ඔහුගෙන් ප්‍රශ්න කරන විට ඔහුගේ යම් වෙනසක් ඇති බව පොලිස් පරීක්ෂක අමිල ගෝවින්නට පෙනී ගියේ එකවරමය. පිළිතුරු දීමේදී විලී මාමාගේ වචන පැටළෙන ස්වභාවයක්ද තමන් දෙස එක එල්ලේ බැලීමට අපහසු බවක්ද විලී කෙරෙන් දිස් වූයේ පොලිස් පරීක්ෂක අමිලගේ සැකය තවදුරටත් තීව්‍ර කරමිනි.

"මං නිදා ගත්තෙ සර් අන්න අර කැඩිච්ච කාර් එක ඇතුළේ. මං ඔය ගැන මොකුත් දන්නෙ නෑ."

විලී මාමා එලෙස පැවසුවද පොලිස් පරීක්ෂක අමිලගෙන් ගැලවීම පහසු නොවිය. ඒ දක්ෂ විමර්ශකයෙකුගේ හැටිය. සැකය පසුපස හඹා යාම සූක්ෂ්ම අයුරින් සිදු කිරීම මෙන්ම නිවැරැදි ඉලක්කය කරා ලුහුබැඳ යාමද පොලිස් පරීක්ෂක අමිල ගෝවින්නට අලුත් අත්දැකීමක් නොවන්නේ මෙතෙක් කලක් අපරාධකරුවන් කොටු කර ගැනීම සඳහා ලබා ඇති පන්නරය සුළු පටු නොවන බැවිනි. මේ නිසා අවසානයේ විලී මාමාට සිදු වූයේ අකුරක් නෑර ඇත්ත පැවසීමටය.


සුරේෂ් ධනුෂ්ක

"මට පාන්දර කිට්ටුව ඇහැරුණා. එතකොට කොල්ලා නිදි. මට ඌව දකිනකොට දවල් මට ගහපු පාර මතක් වුණා. මම ගැරේජ් එක ඇතුළට ගිහින් ටයර් ලෙවල් කරන බටයක් ගෙනල්ල ඌට පතබෑවා. ඒ වුණාට මරන්න හිතාගෙන නං නෙමෙයි. කළුවරේ දැක්කෙ නෑ කොහාට වැදුණද කියල. පස්සෙ මං ගිහින් හදන්න ගෙනත් දාල තිබුණ කාර් එක ඇතුළට වෙලා නිදා ගත්තා."

පහර දීමට යොදාගත් යකඩ බටය ගරාජය අසල ඇති කෙසෙල් කොටුවට විසි කර දමා තිබියදී සොයා ගැනීමට පොලිස් නිලධාරින්ට හැකි විය.




පහර දීමට යොදාගත් යකඩ බටයද සොයා ගනී

වර්ෂ 2023ක් වූ පෙබරවාරි මස 5 වැනිදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.